


# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# வருடாந்த செயல் நிறைவேற்று அறிக்கை

# Annual Perfomance Report

# 2016

නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය

சட்டமும் ஒழுங்கும் மற்றும் தெற்கு அபிவிருத்தி அமைச்ச

**Ministry of Law & Order and Southern Development**

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# 2016

**නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය**

14 වන මහල, සුහුරුපාය, ශ්‍රී සුභූතිපුර පාර,

බත්තරමුල්ල.

# පටුන


| | පිටු අංකය |
|---|---|
| 01. හැඳින්වීම | 01 - 07 |
| දැක්ම | 04 |
| මෙහෙවර | 04 |
| අරමුණු | 05 |
| කාර්යයන් හා කර්තව්‍යයන් | 06 |
| අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය | 07 |
| 02. අමාත්‍යාංශ සමස්ථ කාර්ය සාධනය | 08 - 23 |
| 2.1. රටේ සාමාන්‍ය ජන ජීවිතයේ ස්ථාවරත්වය පවත්වාගෙන යාමට ලබාදුන් සහයන් අතරින් | 08 - 13 |
| 2.2. අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වල කාර්යභාරය කාර්යක්ෂම හා ඵලදායි කිරීමට අවශ්‍ය පියවර ගනිමින් | 13 - 15 |
| 2.3. අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වල කාර්යක්ෂමතාවය වර්ධනයට ඇති අවස්ථා සලකා බලමින් | 15 |
| 2.4. දක්ෂිණ ප්‍රදේශය සංවර්ධනය කිරීමේ අරමුණට ළඟා වීම සඳහා අවශ්‍ය පියවර ගනිමින් | 16 |
| 2.5. ශ්‍රී ලංකා ජාත්‍යන්තර සහයෝගීතාවය | 16 - 18 |
| 2.6. අමාත්‍යාංශයේ සහ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනවල ප්‍රගතිය අපේක්ෂා කරමින් | 18 - 19 |
| 2.7. අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කාර්යන්ට උර දෙමින් | 19 - 20 |
| 2.8. අධීක්ෂණය කරන ලද සංවර්ධන ව්‍යාපෘති වල කාර්යසාධනය | 20 - 23 |
| 03. ආංශික කාර්ය සාධනය | 24 - 41 |
| 3.1.පාලන අංශය | 24 - 27 |
| 3.2. පොලිස් අංශය | 28 - 30 |
| 3.3. මූල්‍ය අංශය | 31 - 36 |
| 3.4.සැලසුම් සහ අධීක්ෂණ අංශය | 37 - 39 |
| 3.5. සංවර්ධන අංශය | 40 |
| 3.6. අභ්‍යන්තර විගණන අංශය | 41 |

## සංඛ්‍යා වගු විස්තර


| වගු අංකය | නම | පිටු අංකය |
|---|---|---|
| 01 | 2015.12.31 දිනට අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය | 07 |
| 02 | අපරාධ වර්ග අනුව වාර්තාවීම් සහ ප්‍රගතිය | 08 |
| 03 | කාන්තාවන්ට හා ළමයින්ට එරෙහි අපරාධ වාර්තාවීම් හා විසඳීම් | 09 |
| 04 | රථවාහන අනතුරු | 10 |
| 05 | නිද්‍රාජනක ද්‍රව්‍ය | 10 |
| 06 | නිද්‍රා ජනක ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම් ප්‍රමාණය | 11 |
| 07 | දූෂණ හා ව්‍යවස්ථාපිත වැරදි | 11 |
| 08 | විශේෂ කාර්ය බලකාය සිදුකරන ලද අනෙකුත් වැටලීම් | 12 |
| 09 | මහජන දුක්ගැනවිලි ලද හා විසඳූ සංඛ්‍යාව | 13 |
| 10 | දක්ෂිණ ප්‍රදේශය සංවර්ධන ව්‍යාපෘති ප්‍රගතිය | 22 |
| 11 | කාර්ය මණ්ඩල වෙනස්වීම් - 2016 | 24 |
| 12 | දේශීය පුහුණු | 25 |
| 13 | අමාත්‍යාංශයීය මාණ්ඩලික නිලධාරීන්ගේ විදේශීය පුහුණු පිළිබඳ විස්තර | 26 |
| 14 | මූල්‍ය ප්‍රතිපාදනය හා උපයෝජනය - 2016 | 31 |
| 15 | මූල්‍ය ප්‍රතිපාදන සහ උපයෝජනය විස්තරාත්මකව - 2016 | 32 |
| 16 | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම - 2016 වර්ෂය | 33 |
| 17 | විමධ්‍යගත අය වැය වැඩසටහන ප්‍රගතිය | 38 |
| 18 | පැවැත්වූ වැඩසටහන් පිළිබඳ විස්තර | 39 |

# 01. හැඳින්වීම

රටක සංවර්ධනයේ පදනම වනුයේ එරට පවතින සාමකාමී වාතාවරණයයි. සාමකාමී රටක තිරසාර සංවර්ධනය ලඟාකර ගැනීම සඳහා වූ එක් වැදගත් සාධකයක් වනුයේ සමබර සංවර්ධන පිළිවෙතයි. නීතියේ සමානාත්මතාවය ඇති කිරීම සහ අපරාධ, ප්‍රචණ්ඩත්වය, හිංසනය, මැඩපැවැත්වීම මෙන්ම ජීවිතවල දේපලවල සුරක්ෂිත භාවය තහවුරු කිරීමේ අරමුණ මුදුන්පත් කරගැනීම සඳහා 2013/08/16 දිනැති 1823/70 අංක දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් ස්ථාපිත කළ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය, මහජන ආරක්ෂාව සහ මහජන සාමය ස්ථාවර කිරීම සඳහා වගකිවයුතු වූ අතර ඊට අදාළ වූ විෂයපථය ආවරණය කරමින් සිය කාර්යයන් ඉටුකරන ලදී.

***"මෛත්‍රී පාලනයක් - ස්ථාවර රටක්"*** සංකල්පය පෙරදැරි කරගෙන සාමකාමී රටක සමබර සංවර්ධන පිළිවෙතට අවතීර්ණ වීමේ අභිලාශයෙන් 2015/01/18 දිනැති අංක 1897/15 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් මෙම අමාත්‍යාංශ කාර්යභාරය තවදුරටත් පුළුල් කර මහජන සාමය, ආපදා කළමනාකරණ සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය ලෙස ස්ථාපිත විය. ඉන් පසු අවස්ථා ගණනාවකදී අමාත්‍යාංශ විෂය පථයන් එක්වෙමින් සහ ඉවත් වෙමින් කාර්යයන් ඉදිරියට පැමිණි අතර මාතෘභූමියෙහි මහජන සාමය ස්ථාවර කිරීම තුළින් සාමකාමී වටපිටාවක් නිර්මාණය කිරීමේත්, දක්ෂිණ ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා උරදෙමින් රටේ සමබර සංවර්ධනයට දායකවීමේත් වගකීම තීව්‍ර කරමින් 2015/11/24 දිනැති අංක 1942/10 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය පිහිටුවන ලදී.

එමඟින් පශ්චාත් යුධ සමය තුළ රටේ මතු විය හැකි අපරාධ, ප්‍රචණ්ඩත්වය හිංසනය හා නීති විරෝධී ක්‍රියාවන් මැඩ පැවැත්වීම, රටට අවශ්‍ය වන නීතිය හා සාමය පවත්වාගෙන යාම, සමාජ විනය තහවුරු කිරීම, අපරාධ හා සමාජ විරෝධී ක්‍රියා වැළැක්වීම, රථවාහන ගමනාගමනය පාලනය කිරීම මෙන්ම අන්තරායකර ඖෂධ පාලනය හා වැළැක්වීම සඳහා අවශ්‍යවන කාලීනවූත් ඵලදායීවූත් තීරණ ගැනීම වැනි සුවිශේෂී වූ වගකීම් සම්භාරයක් මෙම අමාත්‍යාංශය මඟින් ඉටු කරනු ඇත. එමෙන්ම දක්ෂිණ කලාපීය ආර්ථික සම්පත් තිරසාර ලෙස උපයෝගී කරගනිමින් දක්ෂිණ කලාපයේ ආර්ථික තත්ත්වය නඟාසිටුවීම තුළින් ජන ජීවිතය නඟාසිටුවීමට අවශ්‍ය දායකත්වය ලබා දීම මෙන්ම ගාලු කොටුව සංරක්ෂණය කිරීම තුළින් රටේ පෞරාණික වස්තූන් සුරක්ෂිත කිරීමේ කාර්යයට සහය ලබා දීම ද මෙම අමාත්‍යාංශය වෙත පැවරී ඇත. ඊට අමතරව දක්ෂිණ කලාපයට අයත් වන ගාල්ල, මාතර, හම්බන්තොට සහ මොණරාගල යන දිස්ත්‍රික්කවල විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති අනුමත කිරීමේ වගකීමද ඉටු කරනු ලබයි.

ඊට අමතරව ශ්‍රී ලංකා පොලිසිය, විශේෂ කාර්ය බලකාය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, ගාලු උරුමය පදනම සහ දක්ෂිණ සංවර්ධන මණ්ඩලය යන ආයතන සඳහා ප්‍රතිපත්ති සැකසීම, මඟපෙන්වීම, ක්‍රියාකාරිත්ව අධීක්ෂණය, කාර්ය සාධන ඇගයීම සහ පසුවිපරම් කටයුතු සඳහා අවශ්‍ය සියලු කාර්යයන් සිදුකරමින් අමාත්‍යාංශය විශේෂිත වූ වගකීම් සම්භාරයක් ඉටුකරනු ලබයි.

## මාර්ගෝපදේශකත්වය තහවුරු කරමින්...............

"නව ව්‍යවස්ථා සංශෝධනයක් මඟින් අධිකරණ, පොලීසිය, මැතිවරණ, විගණන හා නීතිපති වැනි ආයතනවල අපක්ෂපාතීත්වය ආරක්ෂා කිරීම පිණිස ස්වාධීන කොමිෂන් සභා ස්ථාපිත කරමි."

"රාජ්‍ය සේවය, ආණ්ඩුවේ ප්‍රතිපත්ති මත ක්‍රියාත්මක වන බව හා අපක්ෂපාතීව ක්‍රියා කරන බව තහවුරු කිරීම සඳහා රාජ්‍ය සේවය හා පොලීසිය සඳහා නිර්දේශපාලනික කුසලතා පදනමක් හඳුන්වා දෙන්නෙමි."

"සියලු තරාතිරම්වල පුද්ගලයන්ගේ නොමනා ක්‍රියා නිසා රටතුළ ඇදහිය නොහැකි පරිමාණයෙන් වර්ධනයවී ඇති දරුවන් හා කාන්තාවන් ගොදුරුවන අපචාර වළක්වාලීමට උපරිම ක්‍රියාමාර්ග ගන්නා අතර ඊට අදාල නඩු විභාග ඉතා කෙටි කලකදී අවසන් කිරීමට අවශ්‍ය පහසුකම් ලබා දෙන්නෙමි. එමඟින් ළමා හා කාන්තා දූෂණ සහ මුලින්ම නවතාලීමට කටයුතු කරන්නෙමි."

(මෛත්‍රී පාලනයක් ... ස්ථාවර රටක් ප්‍රතිපත්ති ප්‍රකාශනය - පිටු අංක 16)

"මත්කුඩුජාවාරම්කරුවන් මැඩලීම සඳහා ජාතික ඔත්තු සේවය, විශේෂ කාර්ය බලකාය, ශ්‍රීලංකා රේගුව, අන්තරායකර ඖෂධ පාලක අධිකාරිය ආදිය ඒකාබද්ධ කර විශේෂ බලකායක් ස්ථාපිත කරන්නෙමි."

"මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් ගලවා ගැනීම සඳහා සුවිශේෂී පුනරුත්තාපන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමට කටයුතු කරන්නෙමි."

(මෛත්‍රී පාලනයක් ... ස්ථාවර රටක් ප්‍රතිපත්ති ප්‍රකාශනය - පිටු අංක 24)

## 2016 අය වැය කථාවෙන්...............

"ගරු කථානායකතුමනි, ගම් මට්ටමේ නීතිය, සාමය සහ ආරක්ෂාව වර්ධනය කිරීමේ අරමුණින් දැනට ඇති පොලිස් ස්ථාන නීතිය හා සාමය පිළිබඳ ගරු අමාත්‍යතුමා සහ පොලිස්පතිතුමා සමඟ සාකච්ඡා කර පොලිස් ස්ථාන සංඛ්‍යාව 428 ක සිට 600 ක් දක්වා වැඩිකිරීමට මා යෝජනා කරනවා. ඒ සඳහා රුපියල් මිලියන 1,000 ක අතිරේක ප්‍රතිපාදන ලබා දීමට මා යෝජනා කරනවා" (382)

"අපේ පොලිස් නිලධාරීන් වැඩකරන්නේ අතිශය වේදනාකාරී තත්ත්වයකයි. ඔවුන් නිතරම හදිසි අවස්ථාවලදී ප්‍රථමයෙන්ම ප්‍රතිචාර දක්වන අය වන අතර ඔවුන් විවිධාකාර සේවාවන් මහජනයා වෙනුවෙන් ඉටු කරනවා. ඔවුන්ට නීතිය හා සාමය ආරක්ෂා කිරීමට හා නවීන රථවාහන හැසුරුවීමේ ක්‍රම පිළිබඳව අඛණ්ඩ පුහුණු පාඨමාලා දේශීය හා විදේශීය වශයෙන් ලබා දීමට යෝජනා කරනවා. මේ සම්බන්ධව රටේ ජාතික පොලිස් පුහුණු ඇකඩමිය ශක්තිමත් කිරීමට යෝජනා කරනවා. මෙම කාර්යය සඳහා රුපියල් මිලියන 100 ක් වෙන්කිරීමට යෝජනා කරනවා" (383)

"අද දින වන විට ජාලගත සන්නිවේදනය උපායමාර්ගික වශයෙන් ඉතා වැදගත් වී ඇත. අපගේ පොලීසියට මෙම පහසුකම භාවිතා කරමින් රාජ්‍ය ආයතන හා මහජනතාව අතර හදිසි අවස්ථාවලදී සම්බන්ධීකරණය සඳහා යොදා ගත හැකිය. මේ සඳහා මා රුපියල් මිලියන 250 ක ප්‍රතිපාදන වෙන් කිරීමට යෝජනා කරනවා" (384)

"අපගේ රජය පොලිස් සේවාව පැහැදිලිවම හඳුනාගෙන ඇති අතර පොලිස් සේවයේ වැටුප් විෂමතාවයන් වර්ෂ දෙකක් තුළදී විසඳීමට කටයුතු කරනු ඇත. එම ගෙවීම් වලින් සියයට 50 ක් ගෙවීම සඳහා රුපියල් මිලියන 3,000 ක් වෙන් කරනවා" (385)

"තවද එක් එක් පොලිස් ස්ථාන වෙනම පිරිවැය ඒකක ලෙස සලකනු ඇති අතර එය ඔවුන්ගේ මූල්‍ය විනය දියුණු කිරීමටද හේතුවනු ඇත" (386)

(පිටු අංකය 63-64)

"ගරු කථානායකතුමනි, දකුණු පළාතේ ආර්ථිකයට ඇති දායකත්වය සියයට 15 පමණ වේ. කෙසේ වුවත්, මේ ප්‍රමාණය වැඩි කර ගැනීම සඳහා වැඩි ඉඩකඩක් ඇති බව මම විස්වාස කරමි. මේ නිසා දකුණු පළාත සංවර්ධනය කිරීමේ උත්සාහය ප්‍රධාන වශයෙන් යොමු වන්නේ වරාය සංවර්ධනය සහ ගුවන්තොටුපල මගී සහ භාණ්ඩ උපකාරක සේවා, කෘෂිකර්මාන්ත පදනම් කරගත් කර්මාන්ත, කෘෂිකර්මාන්ත උපකාරක සේවා වැඩි දියුණු කිරීම, ග්‍රාමීය සනීපාරක්ෂාව නාගරික සංවර්ධනය ආදිය සඳහා වේ. මේ අරමුණ සඳහා ද මිලියන 1,000 ක් වෙන් කිරීමට යෝජනා කරනවා" (504)

(පිටු අංකය 79)

## දැක්ම

"නීති ගරුක රටක් විනය ගරුක සමාජයක් සමඟින් සංවර්ධිත දක්ෂිණ කලාපයක්"

## මෙහෙවර

"රට තුළ නීතිය හා සාමය ස්ථාපිත කිරීම, අන්තරායකාරී ඖෂධ භාවිතය පාලනය හා වැළැක්වීම සහ දක්ෂිණ ප්‍රජාවගේ සමාජ හා ආර්ථික තත්ත්වය තිරසාර පැවැත්මකින් යුතුව ඉහළ නැංවීම"

## අරමුණු

- රට තුළ ජීවත්වන සෑම පුද්ගලයෙකුටම බියෙන් හා සැකෙන් තොරව ජීවත්විය හැකි සාමකාමී වටපිටාවක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා මඟ පෙන්වීම.
- ගමනාගමනය පහසු කිරීම සඳහා රථවාහන හැසිරවීම හා මාර්ග තදබදය අවම කිරීම පිළිබඳ නීති රීති සැකසීම.
- පොලිස් සේවාවේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම උදෙසා ජාතික පොලිස් කොමිෂන් සභාව සමඟ එක්ව අවශ්‍ය පියවර ගැනීම.
- අන්තරායකාරී ඖෂධ භාවිතය, සංසරණය වැළැක්වීම සහ භාවිතා කරන්නන් පුනරුත්ථාපනය කර සමාජගත කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.
- හම්බන්තොට ගුවන් හා නැව්තොට ආශ්‍රිතව කර්මාන්ත හා ප්‍රවර්තන සේවා දියුණු කිරීමද ඇතුළුව දක්ෂිණ කලාපයේ ආර්ථික හා සමාජ සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘති සම්බන්ධීකරණය.
- දකුණු පළාත තුළ යටිතල පහසුකම් සංවර්ධනයට අදාල සම්බන්ධීකරණ කටයුතු.

## කාර්යයන් හා කර්තව්‍යයන්

- නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන විෂයයන් හා අමාත්‍යාංශය යටතට පත්කළ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය, පසු විපරම් කිරීම හා ඇගයීම.
- නීතිය හා සාමය පවත්වාගෙන යාමට මඟ පෙන්වීම.
- සමාජ විනය තහවුරු කෙරෙන පුළුල් ප්‍රතිසංස්කරණ ඇතුළත් උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම.
- ජාතික පොලිස් කොමිෂන් සභාවේ උපදෙස් අනුව පොලිස් සේවාවේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- සමාජ ව්‍යසනයක් බවට පත්ව තිබෙන විවිධ අන්දමේ අපරාධ හා සමාජ විරෝධී ක්‍රියා වැළැක්වීමට හා මැඩ පැවැත්වීමට මඟ පෙන්වීම.
- රථවාහන ගමනාගමනය පාලනය කිරීම සඳහා මඟ පෙන්වීම.
- අන්තරායකාරී ඖෂධ භාවිතය වැළැක්වීමට හා පාලනයට සහය වීම.
- කර්මාන්ත ප්‍රවර්ධනය ඇතුළුව දක්ෂිණ ආර්ථික කලාපය ශක්තිමත් කිරීම සඳහා ආර්ථික හා සමාජ සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති සම්බන්ධීකරණය.
- හම්බන්තොට ආර්ථික කලාපය, දක්ෂිණ සංචාරක සංවර්ධන කලාපය, හම්බන්තොට ගුවන් නාවික බල සැපයුම් කේන්ද්‍රය ඇතුළුව දකුණු පළාත තුළ යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම.
- දකුණු පළාත් සංවර්ධන මණ්ඩලය ස්ථාපිත කිරීම.
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු සඳහා මඟ පෙන්වීම.
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන් අධීක්ෂණය කිරීම.

# අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය

## 2016.12.31 දිනට අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය

සංඛ්‍යා වගුව - 01

| අනු අංක | තනතුර | සේවය | පන්තිය | වැටුප් පරිමාණය | අනුමත ගණන | | | 2016.12.31 දිනට සේවක ගණන | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ස්ථිර | අනියම් | කොන්ත්‍රාත් | ස්ථිර | අනියම් | කොන්ත්‍රාත් |
| 1 | ලේකම් | - | - | SL -2006 | 01 | | | 01 | | |
| 2 | අතිරේක ලේකම් | ශ්‍රී.ලං.ප.සේ | විශේෂ | SL 3-2006 | 02 | | | 02 | | |
| 3 | ප්‍රධාන මූල්‍ය නිලධාරී | ශ්‍රී.ලං.ග.සේ | විශේෂ | SL 3-2006 | 01 | | | | | 01 |
| 4 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ | I | SL 1-2006 | 03 | | | 03 | | |
| 5 | අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේ | I | SL 1-2006 | 01 | | | 01 | | |
| 6 | අධ්‍යක්ෂ (සැලසුම්) | ශ්‍රී.ලං.ක්‍ර.සේ | I | SL 1-2006 | 01 | | | 01 | | |
| 7 | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ | I | SL 1-2006 | 01 | | | 01 | | |
| 8 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී.ලං.ග.සේ | I | SL 1-2006 | 01 | | | 01 | | |
| 9 | සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) | ශ්‍රී.ලං.ක්‍ර.සේ | II/III | SL 1-2006 | 01 | | | 01 | | |
| 10 | සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ | II/III | SL 1-2006 | 03 | | | 02 | | |
| 11 | ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ | II/III | SL 1-2006 | 02 | | | 01 | | |
| 12 | නීති නිලධාරී | දෙපාර්තමේන්තුගත | II/III | | 01 | | | | | |
| 13 | පරිපාලන නිලධාරී | රා.ක.ස.සේ | අධි | MN 7-2006 A | 01 | | | 01 | | |
| 14 | භාෂා පරිවර්තක ( සිංහල-දෙමළ) | භා.ප.සේ | I/II | MN 6-2006A | 01 | | | | | |
| 15 | භාෂා පරිවර්තක ( සිංහල- ඉංග්‍රීසි) | භා.ප.සේ | විශේෂ , I | MN 6-2006A | 01 | | | 01 | | |
| 16 | සම්බන්ධීකරණ ලේකම් - ලේකම් | තාවකාලික | - | - | | 01 | | | 01 | |
| 17 | තොරතුරු සන්නිවේදන තාක්ෂණික නිලධාරී | තො.ස.තා.සේ | Class II Grade II | MN 6-2006A | 01 | | | | | |
| 18 | සංඛ්‍යා ලේඛන නිලධාරී | | I/II | | 01 | | | | | |
| 19 | සංවර්ධන නිලධාරී | සං.නි.සේ | III,II,I | MN 4-2006 A | 24 | | | 15 | | |
| 20 | නිශ්චල ඡායාරූප ශිල්පී | තාවකාලික | | | 01 | | | | | |
| 21 | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.ක.ස.සේ | III,II,I | MN 2-2006 A | 40 | | | 32 | | |
| 22 | රියදුරු | රි.සේ | III,II,I විශේෂ | PL3-2006 | 15 | | | 13 | | |
| 23 | කාර්යාල කාර්ය සහයක | කා. සේ .සේ | III,II,I, විශේෂ | PL1-2006 | 18 | | | 16 | | 01 |
| 24 | කැමරා ක්‍රියාකරු සහායක | තාවකාලික | | | 01 | | | 01 | | |
| එකතුව | | | | | 122 | 01 | | 92 | 01 | 02 |

*මූලාශ්‍රය - අමාත්‍යාංශ පාලන අංශය*

ප්‍රධාන මූල්‍ය නිලධාරී තනතුරේ සේවය කළ නිලධාරියා 2016.06.28 දින විශ්‍රාම ලැබූ අතර, නැවත 2016.07.14 සිට 2016.12.27 දක්වා එම නිලධාරියාම කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදෙන ලදී. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමු පන්තියේ අධ්‍යක්ෂ තනතුරක් දක්ෂිණ සංවර්ධන මණ්ඩලය පිහිටුවන තෙක් 2016.12.01 දින සිට අනුමත කර ඇත. කාර්යාල කාර්ය සහායක සේවයේ නියුතු නිලධාරීන් 17 දෙනාගෙන් එක් නිලධාරියකු ආදේශක පදනම මත සේවය කරනු ලබයි. අනුමත තනතුරු ලේඛනයට අමතරව අමාත්‍ය මණ්ඩල තීරණයක් මත සහකාර ලේකම්වරු දෙදෙනෙක් (02) (කම්කරු සබඳතා) (ශ්‍රී.ලං.ප.සේ.නොවන) සහ උපාධිධාරී අභ්‍යාසලාභීන් දෙදෙනෙකු (02) සේවය කරයි.

# 02. අමාත්‍යාංශ සමස්ථ කාර්ය සාධනය

රට තුළ නීතිය හා සාමය ස්ථාපිත කිරීම හා දක්ෂිණ ප්‍රදේශ සංවර්ධන කිරීම යන මූලික වගකීම දරමින් අමාත්‍යාංශයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා 2016 වර්ෂය තුළ ප්‍රධාන වැඩසටහන් හා ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන් වල සාධනය සමස්තයක් වශයෙන් රට තුළ සමාජ හා ආර්ථික වර්ධනයට බලපාන ආකාරය ප්‍රධාන කාර්ය සාධන දර්ශක හතරක් ඔස්සේ සලකා බලනු ඇත.

- අපරාධ විසඳීම් ප්‍රගතිය
- වැටලීම් සඳහා විශේෂ කාර්ය බලකායේ දායකත්ව ප්‍රගතිය
- ක්‍රියාකාරී සිවිල් ආරක්ෂක කමිටු හා ක්‍රියාත්මක කළ දැනුවත් කිරීම් වැඩසටහන් ගණන
- අන්තරායකර ඖෂධ භාවිතය හා සංසරණය වැළැක්වීමේ ප්‍රගතිය

## 2.1. රටේ සාමාන්‍ය ජන ජීවිතයේ ස්ථාවරත්වය පවත්වාගෙන යාමට ලබාදුන් සහයන් අතරින්...

### 2.1.1. රට තුළ වාර්තාවන අපරාධ කඩිනමින් විසඳීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය හා උපායමාර්ගික මඟපෙන්වීම් ලබාදීම

අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබිඹු කරන ප්‍රධාන දර්ශකයක් වන්නේ රට තුළ අපරාධ වාර්තාවීම්වල නිරපේක්ෂ ප්‍රමාණය හා වාර්තා වූ අපරාධ විසඳීමේ සාපේක්ෂ අගයයි. අමාත්‍යාංශය මඟපෙන්වීම යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහන් හා ව්‍යාපෘති හේතුවෙන් 2016 වර්ෂය තුළ අපරාධ වාර්තාවීම් ප්‍රමාණය හා අපරාධ විසඳීම් සම්බන්ධයෙන් සිදුව ඇති වෙනස්කම් පහත වගුවෙන් පෙන්නුම් කරයි. ඒ අනුව 2014 වර්ෂයේ වාර්තා වූ 1,180,805 ක අපරාධ සංඛ්‍යාව 2015 වර්ෂයේදී 1,129,555 ක් දක්වා අඩුවී තිබුණු අතර එය සමාලෝචන වර්ෂය තුළදී වාර්තා වීම් 1,155,215 ක් විය.

**අපරාධ වර්ග අනුව වාර්තාවීම් සහ ප්‍රගතිය**

**සංඛ්‍යා වගුව - 02**

| අපරාධවර්ගය | 2014 | | 2015 | | 2016 | |
|---|---|---|---|---|---|---|
| | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් |
| බල අපරාධ | 50,962 | 29,396 | 40,188 | 13,049 | 36,937 | 26,869 |
| සුළු වැරදි පුද්ගලයන්ට එරෙහි | 42,368 | 30,561 | 43,870 | 30,292 | 45,579 | 30,481 |
| සුළු වැරදි දේපල වලට එරෙහි | 21,827 | 11,691 | 30,685 | 14,407 | 33,349 | 15,969 |
| සුළු පැමිණිලි | 1,065,648 | 1,063,413 | 1,014,812 | 1,014,291 | 1,039,350 | 1,038,942 |
| එකතුව | **1,180,805** | **1,135,061** | **1,129,555** | **1,072,039** | **1,155,215** | **1,112,261** |
| ප්‍රතිශතය | | **96%** | | **95%** | | **96%** |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා පොලීසිය*

බල අපරාධ වල විසඳුම් ප්‍රගතිය වන්නේ සැකකරුවන් අත්අඩංගුවට ගත් ප්‍රමාණය වන අතර සුළු වැරදි හා සුළු පැමිණිලි වලදී ශ්‍රී ලංකා පොලීසිය මඟින් හෝ සමථ මණ්ඩලයට යොමුකර හෝ නඩු

පැවරීමෙන් විසඳුම් ලබා දී අවසන් කළ ප්‍රමාණය ප්‍රගතිය ලෙස සඳහන්කර ඇත. සමස්ථ අපරාධ විසඳීම් ප්‍රතිශතය 2014 වර්ෂයේදී 96% ක් වූ අතර 2015 වර්ෂයේදී එම ප්‍රමාණය 95% දක්වා 1% කින් අඩු වුවත් එය, 2016 වර්ෂයේදී නැවතත් 96% ක් දක්වා වර්ධනය කර ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා පොලීසියට හා විශේෂ කාර්ය බලකාය වෙත ලබාදුන් මඟපෙන්වීම් වල යහපත් ප්‍රතිඵලයකි. මේ සඳහා බල අපරාධ විසඳීමේ ප්‍රගතිය ඉහළ යාම ප්‍රධාන වශයෙන් බලපා තිබේ.

## 2.1.2. කාන්තාවන්ට හා ළමයින්ට එරෙහිව සිදුවන අපරාධ වැළැක්වීම හා පාලනය සඳහා අවශ්‍ය සහය ලබාදීම

ළමයින්ට එරෙහිව වාර්තාවූ අපරාධ සහ ඒවාට විසඳුම් ලබාදී ඇති ප්‍රමාණයන් මෙන්ම කාන්තාවන්ට එරෙහිව වාර්තාවූ අපරාධ සහ ඒවාට විසඳුම් ලබාදී ඇති ආකාරයන් දෙස බැලීමේදී 2014 වර්ෂයෙන් 42% ක් වූ විසඳීම් ප්‍රගතිය 2015 වර්ෂයේ අමාත්‍යාංශය මඟින් අදාළ ආයතනවලට අවශ්‍ය නිසි මාර්ගෝපදේශකත්වය ලබාදීම නිසා 68% ක් දක්වා විසඳීම් ප්‍රගතිය වර්ධනය වී ඇති අතර එය 2016 වර්ෂයෙන් 56% ක විසඳීම් ප්‍රගතියක් ළඟා කර ගෙන ඇති බව පහත වගු අංක 03 හි සඳහන් දත්ත තහවුරු කරනු ලබයි. මේ සඳහා මූලික වශයෙන් කාන්තාවන්ට එරෙහි අපරාධවල ඉහළ යාමත් ළමයින්ට එරෙහි අපරාධ විසඳීම් පහළ යාමත් හේතු වී තිබේ.

**කාන්තාවන්ට හා ළමයින්ට එරෙහි අපරාධ වාර්තා වීම් හා විසඳීම්**

**සංඛ්‍යා වගුව - 03**

| අපරාධ වර්ගය | 2014 | | 2015 | | 2016 | |
|---|---|---|---|---|---|---|
| | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් |
| ළමයින්ට එරෙහි අපරාධ | 5,868 | 1,648 | 5,911 | 5,102 | 5,709 | 3,294 |
| කාන්තාවන්ට එරෙහි අපරාධ | 8,434 | 4,399 | 8,288 | 4,579 | 9,042 | 4,986 |
| එකතුව | **14,302** | **6,047** | **14,199** | **9,681** | **14,717** | **8,270** |
| ප්‍රතිශතය | | **42%** | | **68%** | | **56%** |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා පොලීසිය*

## 2.1.3. ජනතාවගේ ජීවිත හා දේපළවල ආරක්ෂාව සැලසෙන පරිදි රථවාහන ගමනාගමනය විධිමත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම

රථවාහන අනතුරු පිළිබඳ තොරතුරු පැහැදිලි කරමින් යාකර ඇති වගු අංක 04 අනුව, රටෙහි ගමනාගමනයට යොදාගෙන ඇති වාහන ප්‍රමාණයේ සීඝ්‍ර වර්ධනයක් සිදුවෙමින් පවතින අවධියක ඊට සමානුපාතිකව වාහන අනතුරු ප්‍රමාණය වර්ධනය වීමේ වේගය මේ අයුරින් පාලනය වී තිබෙනුයේ ඊට අදාළව ගනු ලැබූ වැඩසටහන් වල ප්‍රගතිය හේතුවෙන් බව පෙන්වා දිය හැකිය. ඒ අනුව රථවාහන වැරදි හා රිය අනතුරු සම්බන්ධවූවන්ට විරුද්ධව නඩු පැවරීම, දඩපත් ලබාදීම, රථවාහන තදබදය අවම කිරීම සඳහා රථවාහන කළමනාකරණය කිරීමට නව වැඩසටහන් හඳුන්වා දීම මෙන්ම රථවාහන තදබදයට පිළියම් යෙදීමට අවශ්‍ය නීතිමය පියවර ගැනීම සෘජුවම බලපා ඇති බව තහවුරුවී ඇත.

රථවාහන අනතුරු

සංඛ්‍යා වගුව - 04

| වර්ෂය | මාරක අනතුරු | බරපතල අනතුරු | සුළු තුවාල | අලාභ අනතුරු | මුළු අනතුරු | වාහන සංඛ්‍යාව | වාහන 1,000 කට අනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| **2014** | 2,261 | 6,847 | 12,950 | 13,992 | 36,050 | 5,633,234 | 6 |
| **2015** | 2,590 | 7719 | 13,095 | 13514 | 36,918 | 6,302,141 | 6 |
| **2016** | 2,824 | 8,148 | 14,604 | 13,510 | 39,086 | 6,795,469 | 6 |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා පොලීසිය*

## 2.1.4. නීතිවිරෝධී මත්පැන් සහ නිද්‍රාජනක ද්‍රව්‍ය සම්බන්ධ වැරදි හෙළිදරව් කරගැනීමට අවශ්‍ය පියවරයන් ගැනීම

දිවයින පුරා ක්‍රියාත්මක වන නීති විරෝධී මත්පැන් සහ නිද්‍රාජනක ද්‍රව්‍ය සම්බන්ධ ක්‍රියාකාරකම් පාලනය කිරීම සඳහා අවශ්‍ය උපදෙස් සහ සහයන් ශ්‍රී ලංකා පොලීසිය සහ විශේෂ කාර්ය බලකාය වෙත ලබාදෙමින් ඊට අදාළ වැරදි හෙළිදරව් කරගැනීමටත් එම වැරදි වලට නීතිමය ක්‍රියාමාර්ග ගෙන අවසන් කිරීමටත් අවකාශය ලැබීමෙන් සමාලෝචිත වර්ෂය තුළ වාර්තා වූ නිද්‍රජනක හා සුරා සම්බන්ධ වැරදි වලින් 95% ක් විසඳා අවසන් කිරීමට හැකියාව ලැබී ඇති බව පහත සංඛ්‍යා වගු අංක 05 මඟින් පෙන්නුම් කරනු ලබයි.

නිද්‍රාජනක ද්‍රව්‍ය

සංඛ්‍යා වගුව - 05

| අනු අංක | වරද | 2014 | | 2015 | | 2016 | |
|---|---|---|---|---|---|---|---|
| | | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් |
| 1 | නිද්‍රාජනක ද්‍රව්‍ය සම්බන්ධ වැරදි වාර්තාවීම් සහ විසඳීම් | 74,366 | 71,712 | 89,996 | 87,846 | 88,352 | 86,330 |
| 2 | සුරා සම්බන්ධ වැරදි වාර්තාවීම් සහ විසඳීම් | 114,790 | 110,234 | 113,944 | 109,256 | 120,105 | 111,028 |
| එකතුව | | **189,156** | **181,946** | **203,940** | **197,112** | **208,482** | **197,358** |
| ප්‍රතිශතය | | | **96%** | | **97%** | | **95%** |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා පොලීසිය*

එසේම දිවයින තුළ නිද්‍රාජනක ද්‍රව්‍ය ව්‍යාප්තව ඇති ආකාරය විශ්ලේෂණය කර එමඟින් වැඩිම පැමිණිලි ලැබෙන ප්‍රදේශ හඳුනාගෙන වැටලීම් සිදුකිරීම ප්‍රමුඛත්වයෙන් සලකා කටයුතු කිරීමට අදාළ උපදෙස් ලබාදීම තුළින් රට තුළ සංසරණය වන නිද්‍රාජනක ද්‍රව්‍ය වැඩි ප්‍රමාණයක් අත්අඩංගුවට ගැනීමට හැකිවී ඇති බවත් එම ප්‍රමාණය 2015 වර්ෂයට සාපේක්ෂව 180% න් ඉහළ ගොස් ඇති බවත් පහත සංඛ්‍යා වගු අංක 06 මඟින් තහවුරු කරනු ලබයි.

**නිද්‍රා ජනක ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම් ප්‍රමාණය**

**සංඛ්‍යා වගුව - 06**

| නිද්‍රා ජනක ද්‍රව්‍ය | අත්අඩංගුවට ගත් ප්‍රමාණය | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2014 | | | 2015 | | | 2016 | | |
| | කි.ග්‍රෑ. | ග්‍රෑ. | මි. ග්‍රෑ. | කි. ග්‍රෑ. | ග්‍රෑ. | මි. ග්‍රෑ. | කි. ග්‍රෑ. | ග්‍රෑ. | මි. ග්‍රෑ. |
| ගංජා | 10,758 | 19 | 886 | 13,253 | 55 | 225 | 36,817 | 698 | 506 |
| අබිං | - | 5 | - | - | 249 | 500 | 15 | 399 | 970 |
| හෂීස් | 1 | 95 | 107 | 4 | 187 | 630 | 27 | 443 | 650 |
| හෙරොයින් | 312 | 549 | 4 | 44 | 521 | 89 | 205 | 147 | 430 |
| මෝෆීන් | - | - | 90 | - | - | - | - | 74 | 730 |
| කොකේන් | - | 2 | 964 | 81 | 672 | 333 | 1302 | 735 | 42 |
| වෙනත් | 46 | 852 | 961 | 166 | 751 | 909 | 506 | 523 | 334 |
| **එකතුව** | **11,117** | **1,522** | **3,012** | **13,548** | **2,435** | **2,686** | **38,872** | **3,019** | **3,662** |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා පොලිසිය*

## 2.1.5. දූෂණ මර්දනය සඳහා අවශ්‍ය සහය ලබාදීම

වෛශ්‍යා වෘත්තීය, ගණිකා නිවාස පවත්වාගෙන යාම වැනි දූෂණ වැරදි 6 ක් මෙන්ම හොරෙන් විදුලිය ලබා ගැනීම, බලපත්‍ර රහිතව විවිධ ව්‍යාපාර/කර්මාන්ත වල යෙදීම, නීති විරෝධී දැව ප්‍රවාහනය, නීති විරෝධී වැලි හා පස් ප්‍රවාහනය වැනි ව්‍යවස්ථාපිත වැරදි 31 ක් වර්තමාන සමාජයේ පැවැත්මට අහිතකර ලෙස බලපාන හෙයින් ඒවා මර්දනය කිරීමට අවශ්‍ය පියවර ගැනීම අමාත්‍යාංශ උපදෙස් හා සහායන් මත ශ්‍රී ලංකා පොලිසියේ හා විශේෂ කාර්ය බලකාය මඟින් සිදු කරණු ලබයි. එහි ප්‍රතිඵලයක් ලෙස 2016 වර්ෂයේදී දූෂණ වැරදී හා ව්‍යවස්ථාපිත වැරදි විසඳීම් ප්‍රතිශතය 95% දක්වා ඉහළ ගොස් ඇති බව පහත සංඛ්‍යා වගු අංක 07 විදහාපායි.

**දූෂණ හා ව්‍යවස්ථාපිත වැරදි**

**සංඛ්‍යා වගුව - 07**

| අනු අංක | වරද | 2014 | | 2015 | | 2016 | |
|---|---|---|---|---|---|---|---|
| | | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් |
| 1 | දූෂණ වැරදි (6) | 1,921 | 1,856 | 1,796 | 1,788 | 1,255 | 1,217 |
| 2 | ව්‍යවස්ථාපිත වැරදි (31) | 54,877 | 52,998 | 46,290 | 43,896 | 46,171 | 44,177 |
| **එකතුව** | | 56,798 | 54,854 | 48,086 | 45,684 | 47,426 | 45,394 |
| **ප්‍රතිශතය** | | | **97%** | | **94%** | | 95% |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා පොලිසිය*

## 2.1.6. විශේෂ කාර්ය බලකාය සිදුකරන ලද අනෙකුත් වැටලීම්

අමාත්‍යාංශය යටතේ විශේෂ ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වන විශේෂ කාර්ය බලකාය උපයෝගී කරගනිමින් රට තුළ සිදුවන අවිධිමත් හා විනාශකාරී ව්‍යාපාර මර්දනය කිරීම වෙනුවෙන් අත්අඩංගුවටගත් පුද්ගල ප්‍රමාණයන් සංඛ්‍යා වගු අංක 08 මගින් ඉදිරිපත් කර ඇත.





*විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද මත්ද්‍රව්‍ය වැටලීම් වල අවස්ථාවන්*

**විශේෂ කාර්ය බලකාය සිදුකරන ලද අනෙකුත් වැටලීම්**

සංඛ්‍යා වගුව - 08

| අනු අංක | අත් අඩංගුවට ගත් දෑ | | සිදුවීම් ප්‍රමාණය | අත්අඩංගුවට ගත් ප්‍රමාණය | අත්අඩංගුවට ගත් පුද්ගලයින් ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| 1 | කසල තේ | | 35 | කි.ග්‍රෑ. 757,992.000 | 53 |
| 2 | ගවයින් ප්‍රවාහනය කිරීම | | 42 | ගවයින් 252 | 98 |
| 3 | පාරිභෝජනයට නුසුදුසු මාංශ | | 35 | කි.ග්‍රෑ. 2,236.600 | 67 |
| 4 | අවි ආයුධ හා පුපුරණ ද්‍රව්‍ය | | 44 | මෙරට නිෂ්පාදිත අවි 43<br>රිවොල්වර 01<br>ඩෙටනේටර් 04<br>අත් බෝම්බ 14<br>ෂොට් ගන් අවි කාට්රිජ් 14<br>මෝටාර් උන්ඩ 48<br>පුද්ගල නාශක බෝම්බ 41<br>පැති බෝම්බ 03<br>උන්ඩ 106 | 43 |
| 5 | නීති විරෝධී මැණික් ගැරීම | | 134 | කම්ප්‍රෙෂර් යන්ත්‍ර 124<br>බැකෝ යන්ත්‍ර 34 | 490 |
| 6 | මත් ද්‍රව්‍ය සම්බන්ධ වැටලීම් | මත්පැන් | 247 | රජයේ මත්පැන් 4,092<br>නීති විරෝධී 14,901 | 297 |
| | | සිගරට් | 21 | 223,858 | 27 |
| 7 | වෙනත් | | 68 | - | 152 |
| **එකතුව** | | | **626** | | **1,227** |

*මූලාශ්‍රය - විශේෂ කාර්ය බලකාය*

### 2.1.7. මහජන දුක්ගැනවිලි කළමනාකරණය කිරීමේ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කරමින්

අපරාධයක් සිදුවන අවස්ථාවකදී ඉක්මනින් ක්‍රියාත්මක වීම සඳහා පොලිස් ස්ථාන දැනුවත් කිරීම, පොලිසිය මඟින් ක්‍රියාත්මක කිරීමට පමා වූ හෝ ක්‍රියාත්මක නොවූ කරුණු සම්බන්ධයෙන් සහන ලබා ගැනීම රාජ්‍ය ආයතන හා නිලධාරීන්ට විරුද්ධව පැමිණිලි හා චෝදනා යොමු කිරීම යනාදිය අරමුණු කරගනිමින් මෙම ක්‍රමවේදයන් ක්‍රියාත්මක කෙරේ. ඒවා අතුරින් 118 හදිසි ඇමතුම් අංක හා ජනපතිට කියන්න ව්‍යාපෘතියෙන් ශ්‍රී ලංකා පොලිසියට අදාළ යොමු කිරීම් අමාත්‍යාංශය මඟින් සෘජුවම ක්‍රියාත්මක කරනු ලබන අතර 119 හදිසි ඇමතුම් අංශය, පොලිස්පතිට කියන්න, පොලිස්පති මහජන සහන දිනය, මහජන සහන මැදිරිය ශ්‍රී ලංකා පොලිසිය මඟින් ක්‍රියාත්මක කෙරේ.



*118 හදිසි ඇමතුම් අංශය*

එම ක්‍රමවේදයන් මඟින් 2016 වර්ෂය තුළ ලද හා විසඳූ පැමිණිලි සංඛ්‍යාව පහත සංඛ්‍යා වගුව මඟින් දැක්වේ.

**මහජන දුක්ගැනවිලි ලද හා විසඳූ සංඛ්‍යාව**

සංඛ්‍යා වගුව - **09**

| අනු අංක | කළමනාකරණ ක්‍රමවේදය | 2016 | | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | | ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | විසඳූ පැමිණිලි සංඛ්‍යාව | |
| 1 | ජනපතිට කියන්න | 4,712 | 1,050 | 22% |
| 2 | පොලිස්පතිට කියන්න | 1,849 | 1,757 | 95% |
| 3 | පොලිස්පති මහජන සහන දිනය | 1,323 | 932 | 70% |
| 4 | මහජන සහන මැදිරිය | 1,785 | 1,176 | 65% |
| 5 | 119 හදිසි ඇමතුම් | 1,002,283 | 997,970 | 99% |
| 6 | 118 හදිසි ඇමතුම් | 48,582 | 40,974 | 84% |
| එකතුව | | **1,060,534** | **1,043,859** | 98% |

*මූලාශ්‍රය - 118 හදිසි ඇමතුම් අංශය හා ශ්‍රී ලංකා පොලිසිය*

## 2.2. අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වල කාර්යභාරය කාර්යක්ෂම හා ඵලදායී කිරීමට අවශ්‍ය පියවර ගනිමින්

### 2.2.1. ශ්‍රී ලංකා පොලිසිය නව ආරකින් යුතුව මහජනතාව සමඟ සම්බන්ධ කරවීම

පශ්චාත් යුධ සමයන්හි දී රාජ්‍ය ආයතනයන්හි ප්‍රතිව්‍යුහගතකරණය අන්තර්ජාතිකව පිළිගත් සාධකයක් වන අතර, විශේෂයෙන්ම පොලිසිය වැනි නීතිය සාමය ස්ථාපනය අරමුණු කරගත් ආයතන යුධ මානසිකත්වයෙන් මුදවා සමාජ ගතිකත්වයට සමානුපාතිකව ප්‍රතිසංවිධානය කිරීම මහජන මිත්‍රශීලි පොලිසියක් කරා යන ගමනේදී වඩාත් වැදගත් සාධකයකි. ඒ අනුව ශ්‍රී ලංකා පොලිසියේ

තත්ත්කාලීනව පවත්නා අඩුපාඩු හා දුර්වලතා හඳුනාගෙන නිසි පරිදි යාවත්කාලීන කිරීමට යෝජනා ඉදිරිපත් කිරීමටත්, අනාගතයේ යහපත් සහ කාර්යක්ෂම පොලිස් සේවාවක් රට තුළ ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීමේ අරමුණින් කමිටුවක් පිහිටුවා ඇත. එම ප්‍රධාන කමිටුව නීති, පරිපාලන හා මෙහෙයුම් ලෙස උප කමිටු 03 කින් සමන්විත වන අතර, එමඟින් පොලිස් ප්‍රතිසංවිධානය සඳහා යෝජනා ඉදිරිපත් කරනු ලැබේ. කමිටුව 2016.07.25 දින සිට බලාත්මක වන අතර අවසන් වාර්තාව 2017 මැයි මස වන විට ගරු අමාත්‍යතුමාට ඉදිරිපත් කළ යුතුව ඇත. මේ සම්බන්ධව 19.09.2016 දින බ්‍රිතාන්‍ය පොලිස් ප්‍රතිසංවිධාන විශේෂඥයන්ගේ සහභාගිත්වයෙන් වැඩමුළුවක් පැවැත් වූ අතර පොලිස් ප්‍රතිසංවිධානය සඳහා මහජන අදහස් ලබා ගැනීමට වෙනම වෙබ් අඩවියක් ආරම්භ කිරීමටත් පොලිස් ප්‍රතිසංවිධානය පිළිබඳ මහජන අදහස් ලබාගැනීමේ පර්යේෂණය, ආයතනික විශ්ලේෂණය හා පොලිස් අභ්‍යන්තරය පිළිබඳ ප්‍රමාණාත්මක පර්යේෂණ ව්‍යාපෘතිය යන පර්යේෂණ 03 ක් සිදු කිරීමටත් එහිදී තීරණය විය.



## 2.2.2. ශ්‍රී ලංකා පොලීසිය සඳහා විශ්ව විද්‍යාලයක් ස්ථාපිත කිරීම

ශ්‍රී ලංකා පොලීසිය සඳහා විශේෂිත වූ විශ්ව විද්‍යාලයක් ස්ථාපිත කිරීමට 2015 වර්ෂයේ යෝජනා විය. අමාත්‍යාංශය මඟින් පිහිටුවනු ලැබූ කමිටුවක් මඟින් මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම අදාළව සැලසුම් සකස් කරනු ලබයි. ඒ අනුව පොලිස් නිලධාරීන් මෙන්ම ඊට සමගාමී වෘත්තියන්හි නියලෙන නිලධාරීන් ඇතුළු සිසුන් 500 ක් පමණ මෙම විශ්ව විද්‍යාලයට වාර්ෂිකව බඳවා ගැනීමට අපේක්ෂිතය. මෙහිදී පොලිස් විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය, පොලිස් පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රවේදි උපාධිය ඇතුළු මූලික උපාධි පාඨමාලාවන් මෙන්ම පශ්චාත් උපාධි ද හැදෑරීමට අවස්ථාව ලැබෙන අතර බ්‍රිතාන්‍ය නෝට්න්හැම්, ලිවර්පූල් මෙන්ම ඕස්ට්‍රේලියානු ඩීකින් විශ්ව විද්‍යාලයන්හි සහාය මේ සඳහා ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී. යෝජිත පොලිස් විශ්ව විද්‍යාලය සඳහා අත්තිඩිය ප්‍රදේශයේ පිහිටි ශ්‍රී ලංකා පොලීසියට අයත් අක්කර 16 ක භූමියක් තෝරා ගෙන ඇති අතර විශ්වවිද්‍යාලය පිහිටුවීමේ මූලික කටයුතු 2016 වර්ෂයේදී සිදු කරන ලදී.





### 2.2.3 පොලිස් නිලධාරීන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීමට කටයුතු කරමින්

2016 අයවැය කතාවේදී පොලිස් සේවයේ වැටුප් විෂමතාවයන් විසඳීම අරමුණු කරගනිමින් හඳුනාගත් විෂමතා ප්‍රතිශතාත්මකව වර්ෂ කිහිපයකදී අවම කිරීම සඳහා රු.මි. 3,000 ක් වෙන් කරන ලදී. එම ප්‍රතිපාදන උපයෝජනය කරමින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත නිලධාරීන්ගේ මූලික වැටුපෙන් 17% ක දීමනාවක් 2016 වර්ෂය ආරම්භයේ සිට ගෙවීමට 2016.09.28 දින කටයුතු ආරම්භ කරන ලදී.

### 2.2.4. ස්වයංක්‍රීය දඩපත් ගෙවීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම

රථවාහන වැරදි සඳහා දඩ මුදල් අය කර ගැනීම වේගවත් කිරීමත්, දඩ මුදල් ගෙවීම පහසු කරමින් එකතු කරගන්නා දඩ මුදල් ප්‍රමාණය ඉහළ නංවමින් රාජ්‍ය ආදායම ඉහළ නැංවීමත් අරමුණු කර ගනිමින් රථවාහන වැරදි සඳහා ස්වයංක්‍රීයව දඩමුදල් ගෙවීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට කටයුතු කරමින් පවතී. මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් සහ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවක් ස්ථාපිත කිරීමට කටයුතු කර තිබේ.

### 2.2.5. සමස්ථ දිවයිනේ පවුල්, පදිංචිකරුවන් හා ආයතනවල දත්ත ලියාපදිංචි කිරීම

රට තුළ වෙසෙන පවුල්, පදිංචිකරුවන් සහ ආයතන පොලිස් ආඥා පනතේ (76) වගන්තිය ප්‍රකාරව, පොලිස් චක්‍රලේඛ අංක 2225/70 පරිදි පොලිස් ස්ථාන හරහා ලියාපදිංචි කිරීම සිදු කරනු ලැබේ. 2007 වසරේ ආරම්භ කළ මෙම වැඩසටහන යටතේ පවුල් 2,773,740 ක් සහ 11,104,523 ක ලියාපදිංචි කර ඇති අතර තවදුරටත් ලියාපදිංචි කිරීම් සිදු කරනු ලැබේ.

### 2.2.6. ශ්‍රී ලංකා පොලීසිය සඳහා නව ආචාර ධර්ම පද්ධතියක් එළි දැක්වීම



පොලිස් සේවාව වෘත්තීය මෙන්ම ගුණාත්මක වශයෙන් ඉහළ තත්ත්වයකට ගෙන ඒමේ අරමුණින් පොලිස් ආචාර ධර්ම පද්ධතියක් එළි දැක්වීම නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන ගරු අමාත්‍යතුමා, අමාත්‍යාංශය, ජාතික පොලිස් කොමිසම, ශ්‍රී ලංකා පොලීසිය යන සියළු පාර්ශවයන්ගේ දායකත්වයෙන් 2016.08.24 දින සිදු කරන ලදී.

## 2.3. අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වල කාර්යක්ෂමතාවය වර්ධනයට ඇති අවස්ථා සලකා බලමින්

2016.12.08 දින පුරවැසි ආරක්ෂාව හා ජාතික ආරක්ෂාව අරමුණු කරගනිමින් අපරාධ වැළැක්වීමට නවීන තාක්ෂණය යොදා ගත හැකි ආකාරය සහ ඊට මයික්‍රොසොෆ්ට් ආයතනයේ දායකත්වය ලබාගත හැකි ආකාරය පිළිබඳව සාකච්ඡාවක් මයික්‍රොසොෆ්ට් ආයතනයේ ආසියානු පැසිපික් කලාපීය අධ්‍යක්ෂතුමා ඇතුළු නියෝජිත පිරිසක් සමඟ නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ ගරු අමාත්‍ය සාගල රත්නායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ සහභාගිත්වයෙන් සහ ශ්‍රී ලංකා පොලීසියේ ඉහළ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් අරලියගහ මන්දිරයේදී පැවැත්විණ.



## 2.4. දක්ෂිණ ප්‍රදේශය සංවර්ධනය කිරීමේ අරමුණට ළඟා වීම සඳහා අවශ්‍ය පියවර ගනිමින්

- දක්ෂිණ කලාපය සංචාරක ආකර්ශන කලාපයක් ලෙස සංවර්ධනය කිරීම පිළිබඳ විශේෂ සාකච්ඡාවක් ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් 2016.02.19 දින මාතර දිස්ත්‍රික් මහලේකම් කාර්යාලයේදී පැවැත්වීය.



- දක්ෂිණ ප්‍රදේශයේ ආර්ථිකය නඟා සිටුවීම පිළිබඳ විශේෂ සාකච්ඡාවක් ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් 2016.07.15 දින හම්බන්තොට වරාය පරිශ්‍රය ශ්‍රවණාගාරයේදී පැවැත්විණ. මෙහිදී දක්ෂිණ ප්‍රදේශ සංවර්ධනය කිරීම පිළිබඳ දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලදී.



## 2.5. ශ්‍රී ලංකා ජාත්‍යන්තර සහයෝගීතාවය

- පාකිස්ථානයේ ඉස්ලාමාබාද් නුවර පවත්වන ලද සාක්, අභ්‍යන්තර හා ස්වදේශ අමාත්‍යවරුන්ගේ සැසිවාරය සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය ගරු සාගල රත්නායක මැතිතුමන් සහභාගී වෙමින්



- ශ්‍රී ලංකා රුසියානු තානාපතිතුමා අරලියගහ මන්දිරයේදී නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය ගරු සාගල රත්නායක මැතිතුමන් හමු වී දෙරටට අදාළව වැදගත් කරුණු කිහිපයක් සම්බන්ධයෙන් සාකච්ඡා කළ අවස්ථාවක්.



- නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය ගරු සාගල රත්නායක මැතිතුමන් ඇමරිකානු ආධාර වැඩසටහනේ අධ්‍යක්ෂ හමුවී ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ඇමරිකානු ආධාර වැඩසටහන් සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.



- 2016.04.20 වන දින නිව්යෝක් නුවරදී පැවති ලෝක මත්ද්‍රව්‍ය ගැටළුව පිළිබඳව එක්සත් ජාතීන්ගේ විශේෂ මහා මණ්ඩල සැසිවාරය සඳහා ගරු නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය ගරු සාගල රත්නායක මැතිතුමන් සහභාගී වෙමින් එම සැසිවාරය අමතා ශ්‍රී ලංකාව මත්ද්‍රව්‍ය ජාවාරම් මැඩලීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග පැහැදිලි කළ අතර ඒ සඳහා ජාත්‍යන්තර සහයෝගය හුවමාරු කර ගැනීම පිළිබඳව ද පැහැදිලි කරන ලදී.



එහිදී මත්ද්‍රව්‍ය ජාවාරම් මැඩපැවැත්වීමට අදාලව කළාපීය සහයෝගීතාවය වර්ධනය කර ගැනීම සඳහා ඇෆ්ගනිස්ථානයේ හා සිංගප්පූරුවේ අදාළ විෂයභාර අමාත්‍යවරුන් සමඟ ගරු අමාත්‍යතුමා සාකච්ඡා කරණ ලදී.



- නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය ගරු සාගල රත්නායක මැතිතුමන් ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රමුඛත්වයෙන් නවසීලන්තයේ තෙදින නිල සංචාරයක නිරත වූ අතර එහිදී ශ්‍රී ලංකා පොලීසිය කාර්යක්ෂම හා වඩා සමීප සේවාවක් ලබාදීමට නවසීලන්තයේ ක්‍රමවේද උපයෝගී කර ගැනීම පිළිබඳව සලකා බලන ලද අතර වෙලිංටන් නුවර පිහිටි පොලිස් අණදෙන මූලස්ථානය නිරීක්ෂණය සඳහාද එක්වන ලදී.



- ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා ප්‍රමුඛ දූත පිරිස සමඟ බෙල්ජියමේ නිල සංචාරයක නිරත නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය ගරු සාගල රත්නායක මැතිතුමන් ශ්‍රී ලංකාවට වැදගත් ආර්ථික, දේශපාලනික හා සහයෝගීතාව පිළිබඳ තීරණ ගැනීම සඳහා වූ සාකච්ඡාවන්ට එකතු වන ලදී.



- 2016.10.24 දින ආසියානු හා ශාන්තිකර කලාපීය මත්ද්‍රව්‍ය පිළිබඳව ජාතික ආයතනයන් හී ප්‍රධානීන්ගේ 40 වන සමුළුව කොළඹදී පවත්වන්නට යෙදුනු අතර ඒ සඳහා නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය ගරු සාගල රත්නායක මැතිතුමා සම්බන්ධ වූ අවස්ථාව.






- 2016.10.29 දින නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය ගරු සාගල රත්නායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳව ඉන්දියන් සාගර කලාපීය රටවල අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශවරුන්ගේ ඉහළ පෙළේ සැසිවාරය බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන්නට යෙදුනි.

## 2.6. අමාත්‍යාංශයේ සහ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනවල ප්‍රගතිය අපේක්ෂා කරමින්

### 2.6.1. ආයතනවල කාර්යයන් විධිමත් කිරීම උදෙසා

අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින සියළුම ආයතනවල විෂය භාර නිලධාරීන් සඳහා 2016.11.24 හා 2016.11.25 දෙදින තුළ ගබඩා කළමනාකරණය හා ආයතන කටයුතු සම්බන්ධයෙන් පුහුණු වැඩමුළුවක් පැවැත්විණ. මේ සඳහා නිලධාරීන් 65 දෙනෙකු සහභාගී වන ලදී. වැඩමුළුව මෙහෙයවීම අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් සිදු කරන ලදී.

### 2.6.2. ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම

සමාලෝචිත වර්ෂය තුළදී අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති සියළුම ආයතන සම්බන්ධ කර ගනිමින් පළමු, දෙවන, තෙවන හා සිව්වන කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීමට කටයුතු සංවිධානය කරන ලදී. එමගින් ආයතනයන්හි ඒවාට ආවේණික වූ ගැටළු හඳුනා ගැනීමටත් ඒ සඳහා අවශ්‍ය කඩිනම් විසඳුම් සෙවීමටත් ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත් ඒ අනුව ඉදිරි සැලසුම් සකස් කිරීමට අවශ්‍ය පියවර ගැනීමටත් හැකියාව ලැබුණි.



*ප්‍රගති සමාලෝචන රැස්වීමක අවස්ථාවක්*

### 2.6.3. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම

2016 වර්ෂයේ විගණන සැලැස්මට අනුව පළමු, දෙවන, තෙවන හා සිව්වන කාර්තු සඳහා අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත් වූ අතර ශ්‍රී ලංකා පොලීසිය සම්බන්ධයෙන් 2016.06.22 වන දින පැවති ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමුකිරීම සඳහා පිළිතුරු වාර්තා සකස් කිරීම හා එම කටයුතු සම්බන්ධීකරණය කරන ලදී.



## 2.7. අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කාර්යයන්ට උර දෙමින්

- 2015 අංක 04 දරණ අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහාය දීම හා ආරක්ෂා කිරීමේ පනතේ නීතිමය ප්‍රතිපාදනයන්ට අනුව අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ පාලක කමිටු සාමාජිකාවක් ලෙස අමාත්‍යාංශ අතිරේක ලේකම් (පාලන) නියෝජනය කිරීම.

- අමාත්‍යාංශය නියෝජනය කරමින් අතිරේක ලේකම් (පාලන) ජාත්‍යන්තර රතුකුරුස සංවිධානයේ මූල්‍ය දායකත්වය යටතේ මෙහෙයවන අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල නොවන පරිදි බන්ධනාගාර රැඳවියන් ප්‍රමාණය ඉක්මවමින් අතිවාස වීම අවම කිරීම පිළිබඳ පාර්ශව සහභාගීත්ව කමිටුවේ සාමාජිකාවක් ලෙස කටයුතු කිරීම.

- ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම යන මැයෙන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පැවැත්වෙන ආංශික අධීක්ෂණ අනුකමිටු සාමාජිකාවක ලෙස ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම සඳහා අමාත්‍යාංශය නියෝජනය කිරීම.

- ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින ආයතන විසින් මෙහෙයවන වැඩසටහන් සඳහා අමාත්‍යාංශය නියෝජනය කරමින් සම්බන්ධීකරණ නිලධාරිනියක වශයෙන් සක්‍රීය දායකත්වය ලබා දීම.

- මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය සමඟින් සම සභාපතිත්වය දරන යුරෝපා සංගමය යටතේ එන "ස්විච් ඒෂියා" ව්‍යාපෘතිය මඟින් ක්‍රියාත්මක කරනු ලබන "ශ්‍රී ලංකාවේ තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදනය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සැකසීමට සහාය වීම" යන වැඩසටහන මඟින් "හරිත ගම්මාන" සංකල්පයේ වැදගත්කම රටට හඳුන්වා දීමේ කාර්යයෙහි මෙම අමාත්‍යාංශයේ කමිටු සාමාජිකාව ලෙස අධ්‍යක්ෂ සැලසුම් කටයුතු කරනු ලබයි. එහි තෙවන කමිටු රැස්වීමේදී නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා පොලීසිය වැනි ග්‍රාමීය මට්ටමින් විශාල කාර්ය භාරයක් ඉටු කරන නිලධාරී කණ්ඩායම් වලට ද දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අදාළත්වය පැහැදිලි කරන ලදුව ස්විච් ඒෂියා ව්‍යාපෘතියේ විශේෂඥයින් විසින් එය ඉතා වැදගත් සන්ධිස්ථානයක් සේ සලකා 2017 වර්ෂයේදී දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට හැකි වන සේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ගැනීමට තීරණය කෙරුණි.



- උප පොලිස් පරීක්ෂක තනතුර හා ඊට පහළ ශ්‍රේණිවල පොලිස් නිලධාරීන්ගේ උසස් වීම් පිළිබඳ දුක් ගැනවිලි සොයා බලා නිසි නිර්දේශ ඉදිරිපත් කිරීමේ කමිටුව සඳහා අමාත්‍යාංශය නියෝජනය කරමින් ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පොලිස්) සහභාගී වූ අතර ඒ සම්බන්ධයෙන් ජාතික පොලිස් කොමිසම වෙත නිර්නායක වාර්තාවක් කමිටුව මඟින් ඉදිරිපත් කරන ලදී.

- විදේශ කටයුතු අමාත්‍යාංශයේ දී පැවති මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ මෙහෙයුම් කමිටු සාමාජික වශයෙන් ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පොලිස්) සහභාගී වී ඒ සඳහා දායකත්වය ලබා දුනි.

- අනාගත පොලිසිකරණය - දකුණු ආසියානු කලාපීය අනාගත අපේක්ෂා සහ අභියෝග සමුළුවට අදාල මෙහෙයුම් කමිටුවේ සාමාජික වශයෙන් ජ්‍යෙෂ්ඨ සහාකාර ලේකම් (පොලිස්) කටයුතු කරණු ලැබිණි.

- මෝටර් බයිසිකල් ලියාපදිංචිය සඳහා දැනට අනුමත සිලින්ඩර ධාරිතාවය 450 සී.සී. සීමාව ඉක්මවූ එන්ජින් ධාරිතාවයක් සහිත මෝටර් සයිකල් භාවිතය හේතුවෙන් වර්තමානයේ සීඝ්‍රයෙන් වැඩිවන මෝටර් සයිකල් අනතුරු සම්බන්ධයෙන් හා මෝටර් සයිකල් ධාවකයින් සම්පූර්ණයෙන් මුහුණ ආවරණය කරන හෙල්මට් භාවිතය තවදුරටත් පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් පවත්නා නීති රෙගුලාසි සහ ප්‍රමිතීන් පරීක්ෂාකර බලා පවත්වා ගැනීම හෝ සංශෝධන ඉදිරිපත් කිරීම සඳහා වූ අනුකාරක සභාව ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (සංවර්ධන) නියෝජනය කිරීම

- බස්නාහිර කලාපීය මහනගරයෙහි පුළුල් කළමනාකරණ සැලැස්ම යටතේ වූ යෝජනා ක්‍රියාත්මක කිරීම යටතේ නම්‍යශීලී හා විසිරි කාර්යාල වේලාවන් හඳුවාන්වා දීමේ ශක්‍යතා අධ්‍යනයක් සිදුකිරීම, කොළඹ නගරය තුල වාහන ගාල් කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් හඳුනාගත් ස්ථාන වෙන් කිරීම, ශ්‍රී ලංකා පොලිසීයෙන් ක්‍රියාවට නැංවීමට බලාපොරොත්තු වන ආවේක්ශන කැමරා සවිකිරීමට අවශ්‍ය ප්‍රතිපාදන සලසා දීම, පාසල් බස්රථ ප්‍රවාහන සේවා සහ දුර ගමන් බස් රථ සේවා කාර්යක්ෂම කිරීම යනාදිය සම්බන්ධයෙන් සැලසුම් සකස් කිරීමේ වැඩසටහන සඳහා ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (සංවර්ධන) සම්බන්ධ වීම.

## 2.8. අධීක්ෂණය කරන ලද සංවර්ධන ව්‍යාපෘති වල කාර්යසාධනය

- පොලිස් හා විශේෂ කාර්ය බලකා නිලධාරීන්ගේ නේවාසික පහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම් සපුරාලීම පිණිස ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරන ලද පෙරසවි නිවාස ව්‍යාපෘතිය මඟින් 2016 වර්ෂය තුළ ශ්‍රී ලංකා පොලිසියේ ගොඩනැගිලි 113 ක් හා විශේෂ කාර්ය බලකායේ ගොඩනැගිලි 23 ක් ඉදිකර ඇති අතර ඒ අනුව මුළු ව්‍යාපෘතිය මඟින් ශ්‍රී ලංකා පොලිසියේ හා විශේෂ කාර්ය බලකායේ ගොඩනැගිලි පිළිවෙලින් ගොඩනැගිලි 454 ක් හා ගොඩනැගිලි 153 ක් ඉදිකර අවසන් කර ඇත. 2016 වර්ෂය අවසාන වන විට ශ්‍රී ලංකා පොලිසියේ ඉදිකරමින් පැවති ගොඩනැගිලි ප්‍රමාණය 83 ක් වන අතර විශේෂ කාර්ය බලකායේ ඉදිකරමින් පැවති ගොඩනැගිලි ප්‍රමාණය 15 කි. 2016 ප්‍රතිපාදන මඟින් ශ්‍රී ලංකා පොලිසිය රුපියල් මිලියන 259 ක් සහ විශේෂ කාර්ය බලකාය රුපියල් මිලියන 159.49 ක් ව්‍යාපෘතිය වෙනුවෙන් වැය කර තිබේ.

ඉදි කරන ලද පෙරසවි නිවාස වල දර්ශන

- පොලිස් නිලධාරීන් වෘත්තීයමය වශයෙන් සංවර්ධනය කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් නංවාලීම පිණිස කටාන පොලිස් අභ්‍යාස විද්‍යාලය සහ කළුතර පොලිස් විද්‍යාලයේ සංවර්ධනය සඳහා 2016 ප්‍රතිපාදන මඟින් රුපියල් මිලියන 44 ක් වැය කර තිබේ.

- අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ ශ්‍රී ලංකා පොලීසියේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම උදෙසා රු.මි. 1,047.20 ක් වැයකරමින් නව පොලිස් ගොඩනැගිලි ඉදිකිරීමට කටයුතු කරන ලදී. ඉදිකළ ගොඩනැගිලි අතර වැලිපැන්න, ඔඩ්ඩුසුඩාන් යන පොලිස් ස්ථාන, පින්නවල, මොණරාගල යන නව පොලිස් ස්ථාන හා යාපනය මූලස්ථාන පොලිස් ස්ථානය යන ගොඩනැගිලි වේ.

- විශේෂ කාර්ය බලකායේ පවතින ගොඩනැගිලි ගැටළුවට විසඳුම් ලබා දෙමින් රුපියල් මිලියන 125.02 ක් වැයකර ගොඩනැගිලි 16ක් ඉදිකර ඇත. ඒ අතර කටුකුරුන්ද කඳවුරේ උණ්ඩ ගබඩාව ඉදිකිරීම, බුත්තල කඳවුර, 18 කණුව කඳවුර (මහඔය), අරලගංවිල කඳවුර, කටුකුරුන්ද කඳවුර, හපුතලේ කඳවුර, යාපනය කඳවුර, ත්‍රිකුණාමලය කඳවුර, කන්තලේ කඳවුර, දඹුල්ල කඳවුර, මස්කෙලිය කඳවුර, ගම්පොල කඳවුර, කෑගල්ල කඳවුර, උඩවලව කඳවුර, පූගොඩ කඳවුර, රත්ගල්ල කඳවුර යන කඳවුරු වල වැසිකිළි පද්ධති ඉදිකිරීම වේ.



ඉදිකරන ලද කටුකුරුන්ද කඳවුරේ උණ්ඩ ගබඩාව

- 2016 අයවැය කතාව මඟින් ඉදිරිපත් කරන ලද යෝජනාවකට අනුව පොලිස් ස්ථාන ගණන 600 දක්වා ඉහළ නැංවීමට වෙන් කරන ලද ප්‍රතිපාදන භාවිතා කරමින් පොලිස් ස්ථාන සංවර්ධනය කිරීම සඳහා රු.මි. 149 ක් වර්ෂය තුළදී දරන ලදී.

- ශ්‍රී ලංකා පොලීසියේ ජාතික පොලිස් අභ්‍යාස විද්‍යාලයේ පුහුණු පාඨමාලා නවීකරණය කරමින් පොලිස් නිලධාරීන් සඳහා ගුණාත්මක හා ඵලදායී පුහුණුවක් ලබා දීම සඳහා 2016 ජාතික අයවැය මඟින් වෙන් කරන ලද ප්‍රතිපාදන රු.මි.34.9 වැය කරන ලදී.

- 2016 අයවැය කතාව මඟින් ශ්‍රී ලංකා පොලීසියේ ජාලගත සන්නිවේදන ක්‍රමවේදයන් සංවර්ධනය කිරීමට වෙන් කරන ලද ප්‍රතිපාදන භාවිතා කරමින් රු.මි. 92.11 ක් වියදම් දරණ ලදී.

- 2016 වර්ෂය තුළ දක්ෂිණ ප්‍රදේශය සංවර්ධනය සඳහා 2015 අයවැය කථාවේදී වෙන්කළ රු.මි.1,000 ක ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් ගාල්ල, මාතර සහ හම්බන්තොට යන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 689 ක ප්‍රගතිය පහත වගු අංක 10 මඟින් දැක්වේ.





**දක්ෂිණ ප්‍රදේශය සංවර්ධන ව්‍යාපෘති ප්‍රගතිය**


සංඛ්‍යා වගුව - 10

| දිස්ත්‍රික්කය | වෙන් කළ ප්‍රතිපාදන (රු. මි.) | අනුමත කල ව්‍යාපෘති ගණන | මූල්‍ය ප්‍රගතිය (රු. මි.) | වැඩ අවසන් කළ ව්‍යාපෘති ගණන | අවිච්ඡේද ව්‍යාපෘති ගණන |
|---|---|---|---|---|---|
| ගාල්ල | 84.89 | 86 | 44.05 | 66 | - |
| මාතර | 605.29 | 519 | 346.47 | 347 | 13 |
| හම්බන්තොට | 140.12 | 84 | 92.63 | 83 | - |
| එකතුව | 830.30 | 689 | 483.15 | 496 | 13 |

*මූලාශ්‍රය - අමාත්‍යාංශ සැලසුම් අංශය*

- **ගාලු කොටුවේ ඔරලෝසු කණුව සංරක්ෂණය කිරීම**

ගාලු කොටුවේ වාස්තු විද්‍යාත්මක නිර්මාණ අතර සුවිශේෂී ස්ථානයක් හිමි වන නිර්මාණයක් ලෙස ඔරලෝසු කණුව හැඳින්විය හැකිය. සඳු අට්ටාලය නැතහොත් මූන් බැස්ටියන් මුර කුටිය ආසන්නයේ පසු කලෙක කරන ලද ඉදිකිරීමක් වන මෙය වසර ගණනාවක් තිස්සේ දුර්වර්ණ වී තිබූ හෙයින් ප්‍රතිසංස්කරණ කටයුතු 2015 වර්ෂයේ ආරම්භ කරන ලදී. එහි දෙවන අදියර ලෙස පිටත බිත්ති අළුත්වැඩියා කිරීම් මෙම වසරේ ක්‍රියාත්මක කරන ලදී. මේ සඳහා ගාලු උරුමය පදනමේ 2016 ප්‍රතිපාදන මඟින් දරා ඇති වියදම රු. මි. 6.55 කි.



- **සඳු අට්ටාලයේ යුධ කාමර සංරක්ෂණය කිරීම (වායු සමීකරණය කිරීම)**

ගාලු කොටුව මත කාල තුවක්කු සවිකරන ලද මුරකුටි, අට්ටාල හෙවත් බැස්ටියන් 16 ක් වේ. පැරණි අට්ටාල සංරක්ෂණය කිරීම මෙන්ම සංචාරකයින්ගේ නැරඹුම් මධ්‍යස්ථාන ලෙස වැඩිදියුණු කිරීම අරමුණු කර ගනිමින් මෙම වර්ෂය තුළදී ඉන් අට්ටාල 04 ක් සංරක්ෂණය කිරීමට අවශ්‍ය කටයුතු ආරම්භ කරන ලදී.

ඒ අනුව සංරක්ෂිත සඳු අට්ටාල වායු සමීකරණය කිරීමත්, සඳු අට්ටාලය තුළ ඉදි කරන ලද සිතුවම් සහ ප්‍රතිමා වල නාම පුවරු සකස් කිරීමත් ක්‍රියාත්මක කෙරිණ. 2016 ගාලු උරුමය පදනමේ ප්‍රතිපාදන මත රු.මි. 0.86 ක වියදමක් දරා ව්‍යාපෘතියේ කටයුතු නිම කර ඇත.





- **පවුරක උරුමය පොත මුද්‍රණය කිරීම**

ලෝක උරුමයක් වන ගාලු උරුමය පිළිබඳ දේශීය විදේශීය සංචාරකයන් පාසල් සිසුන් ඇතුළු ගාලු කොටුව පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයන් දැනුවත් කිරීමේ අරමුණින් ඔවුන් වෙත අලෙවි කිරීම සඳහා ගාලු කොටුව පිළිබඳ පොතක් ගාලු උරුමය පදනම මඟින් මුද්‍රණය කිරීමට කටයුතු කරන ලදී.

# 03. ආංශීය කාර්ය සාධනය

## 3.1. පාලන අංශය

අමාත්‍යාංශයේ සියළුම ආයතනික සහ අභ්‍යන්තර පරිපාලන කටයුතු පාලන අංශය මඟින් සිදුකරනු ලබයි.

- වර්ෂය තුළදී සංඛ්‍යා වගු අංක 11 පරිදි අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ වෙනස්වීම් සිදු වූ අතර ඊට අදාළව සිදු කළ යුතු කටයුතු පාලන අංශය මඟින් සිදු කරන ලදී.

**කාර්ය මණ්ඩල වෙනස්වීම් - 2016**

**සංඛ්‍යා වගුව - 11**

| අනු අංක | තනතුර | සේවය | අනුමත සේවක සංඛ්‍යාව | ස්ථාන මාරුවී ගිය නිලධාරීන් | විශ්‍රාම ගිය නිලධාරීන් | ඉල්ලා අස්වූ නිලධාරීන් | ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන් |
|---|---|---|---|---|---|---|---|
| 1 | අතිරේක ලේකම් | ශ්‍රී.ලං.ප.සේ. | 02 | 01 | - | - | 02 |
| 2 | ප්‍රධාන මූල්‍ය නිලධාරී | ශ්‍රී.ලං.ග.සේ | 01 | - | 01 | | |
| 3 | අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේ. | 01 | - | - | - | 01 |
| 4 | සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ. | 03 | - | - | - | 01 |
| 5 | පරිපාලන නිලධාරී | රා.ක.ස.සේ. | 01 | - | - | - | 01 |
| 6 | භාෂා පරිවර්තක (සිංහල-ඉංග්‍රීසි) | භා.ප.සේ. | 01 | - | - | - | 01 |
| 7 | සංවර්ධන නිලධාරී | සං.නි.සේ. | 24 | 01 | | | |
| 8 | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.ක.ස.සේ. | 40 | 03 | - | - | 01 |
| 9 | රියදුරු | රි.සේ. | 15 | 02 | - | - | 03 |
| 10 | කාර්යාල කාර්ය සහයක | කා.සේ.සේ. | 18 | 01 | - | - | 02 |

*මූලාශ්‍රය -අමාත්‍යාංශ පාලන අංශය*

- කාර්ය මණ්ඩලයේ දැනුම, තාක්ෂණික හැකියාව සහ භාෂා ප්‍රවීණතාවය වර්ධනය කිරීම අරමුණු කරගෙන දේශීය පුහුණු පාඨමාලා 23 ක් සඳහා 2016 වර්ෂයේ නිලධාරීන් 255 දෙනෙකු යොමු කරන ලදී.

**දේශීය පුහුණු**

**සංඛ්‍යා වගුව - 12**

| පුහුණු පාඨමාලාව | යොමු කරන ලද නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|
| නිපුණතා සංවර්ධන අරමුදල මඟින් පවත්වනු ලබන වැඩමුළු සහ පුහුණු පාඨමාලා - නිවැරදි ආකල්ප වර්ධනය තුළින් අභිප්‍රේරණය | 04 |
| කථන පුහුණු ඉංග්‍රීසි භාෂා සහතික පත්‍ර පාඨමාලාව | 01 |
| ඉහළ ශ්‍රම ඵලදායිතාවය සඳහා කාර්යාල කාර්ය සහායක කාර්යභාරය | 08 |
| ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය සඳහා යෝග්‍යතම භාවිතාවන් | 01 |
| කාර්යාල පරිපාලනය සහ අධීක්ෂණය | 02 |
| ශ්‍රී ලංකා පුහුණු හා සංවර්ධන ආයතනයේ ජාතික සමුළුව සහ පුහුණු වැඩමුළුව | 04 |
| මානව සම්පත් කළමනාකරුවන් සඳහා තිබිය යුතුම නිපුණතාවයන් | 01 |
| ආයතන සංග්‍රහයේ විධිවිධාන පිළිබඳව රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධරයන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන | 02 |
| කාර්යාල කළමනාකරණය හා කාර්යාල විධි ක්‍රම | 09 |
| මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමාව | 01 |
| වැටුප් කළමනාකරණය හා වැටුප් පරිවර්තනය | 07 |
| විමෝචන ප්‍රමිතීන් පවත්වාගෙන යාම පිළිබඳ රාජ්‍ය ආයතනවලට සම්බන්ධ ප්‍රවාහන නිලධාරීන් දැනුවත් කිරීම | 01 |
| ගැටළු විසඳීම හා තීරණ ගැනීම | 02 |
| රාජ්‍ය ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 02 |
| පෞද්ගලික ලිපි ගොනුවක් ඵලදායී ආකාරයෙන් පවත්වාගෙන යාම | 02 |
| ගිණුම්කරණ කාර්යභාරය | 03 |
| සිද්ධි කළමනාකරණය | 02 |
| ගුණාත්මක වැඩ පරිසරයක් සඳහා කාර්යාල කාර්ය සහායක සහ රියදුරන්ගේ වෘත්තීය සංවර්ධනය | 06 |
| ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ පුහුණු වැඩසටහන | 02 |
| ආයතන සංග්‍රහයේ විධිවිධාන පිළිබඳව රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන | 02 |
| බැහැරගත ක්‍රියා විධි පුහුණුව | 48 |
| ගබඩා කළමනාකරණය හා ආයතනික කටයුතු | 65 |
| සේවයේ සාරවත්භාවය පිළිබඳ පුහුණු වැඩසටහන | 80 |
| **එකතුව** | **255** |

*මූලාශ්‍රය -අමාත්‍යාංශ පාලන අංශය*

- 2016 වර්ෂය තුළ අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන් 07 දෙනෙකු විදෙස් පුහුණු සහ සමුළු 08 ක් සඳහා සහභාගී වී ඇති අතර ඒ පිළිබඳ තොරතුරු පහත වගු අංක 13 මඟින් දැක්වේ.

**අමාත්‍යාංශයීය මාණ්ඩලික නිලධාරීන්ගේ විදේශීය පුහුණු පිළිබඳ විස්තර**

සංඛ්‍යා වගුව - 13

| නිලධාරියාගේ නම | තනතුර | රට | පුහුණු පාඨමාලාව / සමුළුව | කාලය |
|---|---|---|---|---|
| විජිතා සෙනෙවිරත්න මිය | අතිරේක ලේකම් | ද.කොරියාව | ප්‍රාදේශීය සංවර්ධන ප්‍රතිපත්ති | සති 03 |
| විජිතා සෙනෙවිරත්න මිය | අතිරේක ලේකම් | පාකිස්ථානය | නීතිය හා සාමය පිළිබඳ 07 වන සාක් රැස්වීම | දින 03 |
| නීල් හපුහින්න මයා | අතිරේක ලේකම් | හවායි | ජාතීන් අතර ආරක්ෂක සහයෝගීතාව පිළිබඳ පාඨමාලාව | දින 05 |
| නිශාන්ත වීරසිංහ මයා | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | චීනය/ තායිලන්තය | චීනයේ චොන්ගින් සහ තායිලන්තයේ රෙයෝන්ඩ් ඉන්ඩස්ට්‍රියල් පාක් සංචාරය | දින 06 |
| ඩී. එස්. සමරවික්‍රම මයා | ප්‍රධාන අභ්‍යන්තර විගණක | තායිලන්තය | කළමනාකරණය (විගනණ) පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව, කසට්සාට් විශ්ව විද්‍යාලය | දින 08 |
| එල්. එස්. ගුණසේකර මිය | සහකාර ලේකම් | චීනය | සංවර්ධනය වෙමින් පවතින රටවල වැදගත් අවස්ථාවන්හී ආරක්ෂාව පිළිබඳ පුහුණු පාඨමාලාව | දින 14 |
| ඕෂධ ගුණතිලක මයා | සහකාර ලේකම් | මියන්මාරය | මත්ද්‍රව්‍ය සහ විෂ රසායනද්‍රව්‍ය අනවසර ප්‍රවාහනය වැළැක්වීම සම්බන්ධ බිම්ස්ටෙක් අනු කාණ්ඩ රැස්වීම | දින 02 |
| වී.කේ.එච්. කෝලිත මයා | ප්‍රධාන ගණකාධිකාරී | තායිලන්තය | කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව, කෙන්සර්ට් විශ්ව විද්‍යාලය | දින 07 |

*මූලාශ්‍රය- පාලන අංශය*

- ආයතන හා පරිපාලන කටයුතුවලට අදාළව අමාත්‍ය මණ්ඩල සංදේශ 12 ක් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර අදාළ කටයුතු සම්බන්ධයෙන් අනුමැතිය ලබා ගෙන තිබේ.

- අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මගින් මෙම අමාත්‍යාංශය සඳහා පුද්ගල අනන්‍යතාවය සඳහා වූ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ (සුහුරුපාය) 14 වන මහළ ලබා ගෙන අමාත්‍යාංශය එම ස්ථානය ස්ථාපිත කිරීමට කටයුතු කරන ලදී.

- 2015 වර්ෂයට වඩා 2016 වර්ෂය වන විට අමාත්‍යාංශයේ වාහන ප්‍රමාණය 25ක් දක්වා ඉහළ නංවා ගැනීමට හැකි වී ඇත. ඒ සඳහා මෙම වර්ෂය තුළ අමාත්‍යාංශය වෙත වාහන 04ක් අළුතින් මිලදී ගෙන ඇති අතර, වාහන 04 ක් පවරා ගැනීමට අවශ්‍ය කටයුතු අවසන් කර ඇත.

- අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන වල ආයතනික සහ පරිපාලනමය කටයුතු සම්බන්ධයෙන් දායක වීම.

    - ශ්‍රී ලංකා පොලිසියේ සිවිල් කාර්ය මණ්ඩලය හා සහයක සේවා තනතුරු 737 ක් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම.

    - වෙනමම පාලන අධිකාරියක් වශයෙන් කටයුතු කරන ලද පුරෝගාමී පාලන අධිකාරිය අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය වෙත අන්තර්ග්‍රහණය කිරීම .

    - අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය සඳහා 2016 වර්ෂයේදී නව තනතුරු ඇති කිරීමට අවශ්‍ය අනුමැතිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලදී. ඒ අනුව අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ අනුමත තනතුරු සංඛ්‍යාව 339 දක්වා ඉහළ නංවාගැනීමට හැකියාව ලැබී ඇත.

    - දක්ෂිණ සංවර්ධන කටයුතු සාර්ථක කර ගැනීමේ අරමුණින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ දක්ෂිණ සංවර්ධන අතුරු මණ්ඩලය පිහිටුවීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම.

- අමාත්‍යාංශයේ කටයුතු කාර්යක්ෂම ලෙසින් හා මහජන හිතකාමී ස්ථානයක් ලෙස පවත්වාගෙන යාම අරමුණු කර ගෙන අමාත්‍යාංශයට අවශ්‍ය වන කාර්යාලීය උපකරණ සහ ලී බඩු මිලදී ගැනීම සම්බන්ධ රාජකාරී කටයුතු ද, කාර්යාල පරිශ්‍රය පිරිසිදු කිරීම හා මනා ලෙස පවත්වාගෙන යාමද, ජල බිල්පත්, විදුලි බිල්පත් හා කාර්යාල කුලී නිරවුල් කිරීම සම්බන්ධ කටයුතු ද පරිගණක ඡායාපිටපත් යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, වාහන ආදියෙහි අළුත්වැඩියා සහ සේවා කටයුතු ද සිදු කිරීම.

## 3.2. පොලිස් අංශය

- අමාත්‍යාංශ අනුමත බල අධිකාරී සීමාවට අයත් විශේෂ කාර්ය බලකායේ සහ ශ්‍රී ලංකා පොලීසියේ තනතුරු උසස්වීම් ලබා දීම යටතේ ශ්‍රී ලංකා පොලීසියේ ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරේ සිට සහකාර පොලිස් අධිකාරී තනතුරට නිලධාරීන් 05 දෙනෙකුට ද සහකාර පොලිස් අධිකාරී තනතුරේ සිට පොලිස් අධිකාරී තනතුරට නිලධාරීන් 71 දෙනෙකුට ද පොලිස් අධිකාරී තනතුරේ සිට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තනතුරට නිලධාරීන් 25 කටද ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තනතුරේ සිට නියෝජ්‍ය පොලිස්පති තනතුරට නිලධාරින් 10 දෙනෙකුට ද නියෝජ්‍ය පොලිස්පති තනතුරේ සිට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තනතුරට නිලධාරීන් 06 දෙනෙකුටද විශේෂ කාර්ය බලකායේ සහකාර පොලිස් අධිකාරී තනතුරේ සිට පොලිස් අධිකාරී තනතුරට නිලධාරීන් 14 දෙනෙතුටද උසස්වීම් ලබා දීමට කටයුතු කර ඇති අතර වැඩබලන සහකාර පොලිස් අධිකාරීවරුන් 57 දෙනෙකු සහ මියගිය වැඩබලන සහකාර පොලිස් අධිකාරීවරුන් 03 දෙනෙකු  සහකාර පොලිස් අධිකාරී තනතුරේ ස්ථිර කිරිමට අදාළ කටයුතු කර ඇත.

- අමාත්‍යාංශ අනුමත බල අධිකාරී සීමාවන්ට අයත් විශේෂ කාර්ය බලකායේ සහ ශ්‍රී ලංකා පොලීසියේ නිලධාරීන් විශ්‍රාම ගැන්වීමට අදාළව සහකාර පොලිස් අධිකාරීවරුන් 06 දෙනෙකු පොලිස් අධිකාරීවරුන් 06 දෙනෙකු ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරුන් 10 දෙනෙකු නියෝජ්‍ය පොලිස්පතිවරුන් 09 දෙනෙකු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් 02 දෙනෙකු විශ්‍රාම ගැන්වීමේ කටයුතු කරන ලදී.

- ශ්‍රී ලංකා පොලීසියේ පොලිස් අධිකාරී තනතුරේ සිට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තනතුර දක්වා විනය ක්‍රියාමාර්ග ගැනීම, පොලිස් නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම සම්බන්ධ ඉල්ලීම් පිළිබඳව කටයුතු කිරීම, උසස්වීම් පෙරදාතම කිරීම හා ඊට අදාළ අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීම වර්ෂය පුරා සිදු කරන ලදී.

- ශ්‍රී ලංකා පොලීසියේ සේවා ගණ 02 කට අදාලව තනතුරු 06 ක සංශෝධිත බඳවාගැනීමේ පටිපාටි සහ පොලිස් වෛද්‍ය කොට්ඨාශයට අදාළව තනතුරු 11 ක බඳවාගැනීමේ හා උසස් කිරීමේ පටිපාටි අනුමැතිය සඳහා ජාතික පොලිස් කොමිසම වෙත යොමු කිරීම.

- පොලිස් භාවිතය තුළින් කෲර අමානුෂික වධහිංසා හා අවමන් සහගත සැලකිල්ලට ලක් කිරීම තුරන් කිරීම අරමුණු කරගනිමින් අමාත්‍යාංශ ලේකම්තුමාගේ සහභාගීත්වයෙන් ක්ෂේත්‍රයේ ප්‍රවීනයන්ගෙන් සමන්විත කමිටුවක් පිහිටුවා මසකට වරක් රැස්ව අමානුෂික පොලිස් භාවිතාවන් අවම කිරීම සම්බන්ධව යෝජනා ඉදිරිපත් කර ක්‍රියාත්මක කරනු ලැබේ. මේ වර්ෂයේ දෙසැම්බර් මාසය තුළ මේ යටතේ වෘත්තීයමය වශයෙන් අපරාධ විමර්ශනය කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරමින් කොට්ඨාශ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී, පොලිස් අධිකාරී, සහකාර පොලිස් අධිකාරී හා පොලිස් ස්ථානාධිපතිවරුන් සඳහා වැඩමුළු පවත්වන ලදී.

- ශ්‍රී ලංකා පොලීසියේ සහ විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් 363 දෙනෙකු සඳහා විදේශ පුහුණු හා සම්මන්ත්‍රණ සඳහා සහභාගීවීමට අනුමැතිය ලබා දී තිබේ.

- දේශපාලන පළිගැනීම් වලට ලක්වූ නිලධාරීන් හට සහන සලසාදීම සම්බන්ධයෙන් සළකා බැලීම සඳහා වූ ත්‍රිපුද්ගල කමිටුව ඉදිරියේ නිලධාරීන් 379 දෙනෙකු සම්මුඛ පරීක්ෂණයට කැඳවන ලදුව, ඉන් 129 දෙනෙකු දේශපාලනමය වශයෙන් අසාධාරණයට ලක් වූ බවට නිර්දේශ ඉදිරිපත් කරන ලදී.  එකී නිලධාරීන් 129 දෙනා සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල

අනුමැතිය ලබා ගෙන එම නිර්දේශ අනුව සහන සලසා දීම සඳහා නිලධාරීන් 67 දෙනෙකුට අදාළව කටයුතු කිරීමට පොලිස් කොමිෂන් සභාව වෙතද නිලධාරීන් 62 දෙනෙකුට අදාළව කටයුතු කිරීමට පොලිස්පති වෙතද යොමු කර ඇත.

- ශ්‍රී ලංකා පොලීසිය සඳහා විශ්ව විද්‍යාලයක් ස්ථාපිත කිරීම සහ මහජන මිත්‍රශීලී කාර්යක්ෂම පොලිස් සේවාවක් ස්ථාපිත කිරීම සඳහා පොලිස් ප්‍රතිසංවිධානය කිරීමට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

- පොලිස් රෝහලේ හෙද සොයුරිය තනතුරු සඳහා සහ උපස්ථායක / උපස්ථායිකාවන් සඳහා නිල ඇඳුමක් නිකුත් කිරීමට අනුමැතිය ලබා දීම සහ මූල්‍ය අපරාධ කොට්ඨාශයේ සියළු නිලධාරීන් / නිලධාරිනියන් සඳහා සිවිල් ඇඳුමින් සැරසී රාජකාරියේ යෙදීමට අනුමැතිය ලබාදීම.

- එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදා රාජකාරී සඳහා හයිටි රාජ්‍යය වෙත නිලධාරින් දෙදෙනෙකු, දකුණු සුඩානය සඳහා නිලධාරීන් 17 දෙනෙකු හා ඩාෆූර් සඳහා නිලධාරින් 17 දෙනෙකු යොමු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම.

- පොලිස් දක්ෂතා පදක්කම ලබා දීම සඳහා නව ලකුණු ලබාදීමේ පටිපාටියක් අනුමැතිය සඳහා ජාතික පොලිස් කොමිසම වෙත යොමු කර ඇති අතර පොලිස් නිලධාරීන් 1,870 ක් සඳහා පූර්ණ භූමි සම්මානය, නිලධාරීන් 45 ක් සඳහා දේශපුත්‍ර සම්මානය නිලධාරීන් 15 ක් සඳහා පොලිස් වීරතා පදක්කම, නිලධාරීන් 581 ක් සඳහා පොලිස් විශිෂ්ට සේවා පදක්කම පිරිනැමීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම.

- පොලිස් ආරක්ෂාව, ප්‍රභූ ආරක්ෂාව සහ ප්‍රභූ ආරක්ෂක පෙරගමන් රථ ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම හා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

- අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගතයුතු අමාත්‍ය මණ්ඩල සංදේශ 23 ක් සකස් කර ගරු අමාත්‍යතුමාගේ අත්සනින් යුතුව අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීම හා ඊට අදාළව ලබා දුන් තීරණ අනුව කටයුතු කිරීම.

- අමාත්‍ය මණ්ඩලය මඟින් ගරු අමාත්‍යතුමාගේ නිරීක්ෂණ සඳහා යොමුකරන වෙනත් අමාත්‍යාංශවල අමාත්‍ය මණ්ඩල සංදේශ 14 ක් සඳහා ගරු අමාත්‍යතුමාගේ නිරීක්ෂණ වාර්තා අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීම.

- නීතිය හා සාමය පවත්වාගෙන යාම උදෙසා ශ්‍රී ලංකා පොලීසියේ කාර්යභාර්යය කාර්යක්ෂම හා ඵලදායී කිරීමට ඉරානය, තුර්කිය, කටාර් රාජ්‍යය, වියට්නාමය, තජිකිස්ථානය යන රටවල් සහ අන්තර්ජාතික ක්‍රිකට් කවුන්සිලය සමඟ අවබෝධතා ගිවිසුම් වලට එළඹීම සඳහා අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීම හා අදාළ කටයුතු ක්‍රියාත්මක කිරීම.

- සමාලෝචිත වර්ෂය තුළ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විසින් පාර්ලිමේන්තුව කල් තබන අවස්ථාවලදී අසන ලද ප්‍රශ්න සම්බන්ධයෙන් පිළිතුරු වාර්තා 35 ක් හා ස්ථාවර නියෝග 23/2 යටතේ ප්‍රශ්න 15 ක් සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීම සහ පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කාරක සභාව, පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාව, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) යන ආයතන වෙතින් ඉල්ලුම් කරන ලද නිර්දේශ වාර්තා ලබා දීමේ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

- න්‍යෂ්ඨික ජාවාරම් පිළිබඳව හයවන අන්තර්ජාතික පොලිස් වැඩමුළුව සම සංවිධානය 2016 ජුලි 4 - 6 සහ මිනිස් ජාවාරම් පිළිබඳ ඒකාබද්ධ කළමනාකරණ කණ්ඩායම් සම්මන්ත්‍රණය 2016 මාර්තු 8 - 9 යන සම්මන්ත්‍රණ සංවිධානය සඳහා අනුමැතිය ලබා දීම සහ ත්‍රස්තවාදය සාධනීයව පිටු දැකීම පිළිබඳව දකුණු ආසියානු සාමාජික රටවල විනිසුරුවන්, අභිචෝදකයන් සහ පොලිස් නිලධාරීන් සඳහා වන එකළොස්වන කලාපීය වැඩමුළුව 2016 ඔක්තෝබර් 3 - 5, මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳව ඉන්දියන් සාගර කලාපීය රටවල අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශවරුන්ගේ ඉහළ පෙළේ සැසිවාරය 2016 ඔක්තෝබර් 28 - 29, ආසියානු හා ශාන්තිකර කලාපීය මත්ද්‍රව්‍ය පිළිබඳව ජාතික ආයතනයන් හී ප්‍රධානීන්ගේ 40 වන සමුළුව 2016 ඔක්තෝබර් 24 - 27 සහ 2016 නොවැම්බර් 3 - 6 දක්වා වියට්නාමයේ ගරු රාජ්‍ය ආරක්ෂක අමාත්‍යවරයාගේ ශ්‍රී ලංකා සංචාරය යන සමුළු සහ සංචාර සංවිධානය සඳහා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.





*වියට්නාමයේ ගරු රාජ්‍ය ආරක්ෂක අමාත්‍යවරයාගේ ශ්‍රී ලංකා සංචාරයේ අවස්ථාවන්*

- විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් අවබෝධතා ගිවිසුම් සහ විවිධ සමුළු 05 ක් සඳහා ඉල්ලුම් කරන ලද නිරීක්ෂණ ඇතුළත් වාර්තා 05 ක් සකස්කර ඉදිරිපත් කිරීම.

## 3.3. මූල්‍ය අංශය

### 3.3.1. මූල්‍ය ප්‍රතිපාදන සහ උපයෝජනය

- 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රතිපාදන ඵලදායී ලෙස කළමනාකරණය කළ අතර ඒ අනුව අමාත්‍යාංශ මූල්‍ය ප්‍රගතිය මුළු ප්‍රතිපාදනයෙන් 85% කි (පුනරාවර්තන වියදම් **94%**, ප්‍රාග්ධන වියදම් **51%**). ජාතික අයවැය දෙපාර්තුමේන්තුව විසින් 2016 ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් සඳහා රු. 9,438,112,000 මුදලක් ප්‍රතිපාදනය කර ඇති අතර රු. 8,048,459,946 වියදම් දරා ඇත.


  මුළු ප්‍රතිපාදනය හා මුළු වියදම ප්‍රාග්ධන හා පුනරාවර්තන ලෙස බෙදී පවතින ආකාරය පහත පරිදි වේ.

**මූල්‍ය ප්‍රතිපාදන සහ උපයෝජනය - 2016**

සංඛ්‍යා වගුව - 14

| වියදම් වර්ගය | මුළු ප්‍රතිපාදනය | | මුළු වියදම | | වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | වටිනාකම (රු.) | ප්‍රතිශතය | වටිනාකම (රු.) | ප්‍රතිශතය | |
| පුනරාවර්තන | 7,466,720,000 | 79% | 7,042,563,911 | 88% | 94% |
| ප්‍රාග්ධන | 1,971,392,000 | 21% | 1,005,896,035 | 12% | 51% |
| **එකතුව** | **9,438,112,000** | **100%** | **8,048,459,946** | **100%** | |

*මූලාශ්‍රය- අමාත්‍යාංශ මූල්‍ය අංශය*



## මූල්‍ය ප්‍රතිපාදන සහ උපයෝජනය ව්‍යාපෘති අනුව විස්තරාත්මකව - 2016


සංඛ්‍යා වගුව - 15
රු.'000


| ව්‍යාපෘතිය | වියදම් වර්ගය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් | මු.රෙ 66 මාරු කිරීම් | ශුද්ධ ප්‍රතිපාදන | මුළු වියදම | වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|
| අමාත්‍ය කාර්යාලය | පුනරාවර්තන | 22,050 | | 5,375 | 27,425 | 25,323 | 92% |
| | ප්‍රාග්ධන | 2,700 | - | - | 2,700 | 1,729 | 64% |
| අමාත්‍යාංශ පරිපාලනය හා ආයතන සේවා | පුනරාවර්තන | 300,600 | 27,300 | 13,625 | 341,525 | 327,727 | 96% |
| | ප්‍රාග්ධන | 57,000 | 21,300 | 740 | 79,040 | 72,385 | 92% |
| විශේෂ කාර්ය බලකාය | පුනරාවර්තන | 6,715,700 | 268,000 | (3,400) | 6,980,300 | 6,640,467 | 95% |
| | ප්‍රාග්ධන | 1,000,000 | - | (540) | 999,460 | 434,217 | 43% |
| දක්ෂිණ සංවර්ධන | පුනරාවර්තන | 93,420 | 17,500 | (15,800) | 95,120 | 49,047 | 52% |
| | ප්‍රාග්ධන | 885,192 | 2,500 | - | 887,692 | 497,565 | 56% |
| රාජ්‍ය අමාත්‍ය කාර්ය මණ්ඩලය | පුනරාවර්තන | 22,350 | - | - | 22,350 | - | 0% |
| | ප්‍රාග්ධන | 2,500 | - | - | 2,500 | - | 0% |
| එකතුව | පුනරාවර්තන | 7,154,120 | 312,800 | (200) | 7,466,720 | 7,042,564 | 94% |
| | ප්‍රාග්ධන | 1,947,392 | 23,800 | 200 | 1,971,392 | 1,005,896 | 51% |
| මුළු එකතුව | | **9,101,512** | **336,600** | - | **9,438,312** | **8,048,460** | **85%** |


*මූලාශ්‍රය - අමාත්‍යාංශ මූල්‍ය අංශය*


රාජ්‍ය අමාත්‍යාංශ ව්‍යාපෘතිය සඳහා රාජ්‍ය අමාත්‍යවරයෙකු නොමැති වීම නිසා වියදම් හට ගැනීමක් සිදු නොවිය.

### මුළු ප්‍රතිපාදනය සහ වියදම ව්‍යාපෘති අනුව



### 3.3.2. මූල්‍ය කටයුතු පවත්වා ගෙන යාම

- 2017 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමේදී මෙම අමාත්‍යාංශය යටතේ පැවති ආයතනයන් හි අයවැය ඇස්තමේන්තු ද රැස් කර 2016.8.22 දින අමාත්‍යාංශ ලිපි අංක Minlo/ACC/20/16 යටතේ අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු කර ඇත.

- රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් වියදම් හා ලැබීම් සීමාවන් මනා ලෙස කළමනාකරණය කරගනිමින් පවත්වාගෙන යන ලදී. අත්තිකාරම් "බී" ගිණුමේ ආරම්භක ශේෂය 2016.01.01 දිනට රු. 167,732,709.50 වූ අතර එහි අවසාන ශේෂය 2016.12.31. දිනට රු. 129,161,105.00 කි.

**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම - 2016 වර්ෂය**

**සංඛ්‍යා වගුව - 16**
**රු.'000**

| කාරණය | වියදමෙහි උපරිම සීමාව | ලැබීමේ අවම සීමාව | උපරිම හර ශේෂ සීමාව |
|---|---|---|---|
| විසර්ජන පනතින් බලය දෙනු ලැබූ සීමාවන් | 210,000 | 90,300 | 400,000 |
| වර්ෂය අවසානයේ තත්‍ය අගයන් | 74,488 | 113,060 | 129,161 |
| එකතුව | 284,488 | 203,360 | 529,161 |

*මූලාශ්‍රය -අමාත්‍යාංශ ගිණුම් අංශය*

- මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළයුතු පහත වාර්තා අදාළ කාල සීමාවන් තුළ නියමිත පරිදි යොමු කිරීමට කටයුතු කිරීම.
  - මාසික අක් මුදල් ඉල්ලුම් පත්‍රය - සෑම මාසයකම වැඩ කරන පළමු දිනයන්හිදී
  - මාසික ගිණුම් සාරාංශය - සෑම මසකම මුල් දින 02 තුළදී
  - 2015 වාර්ෂික ගිණුම් සාරාංශයේ පළමුවෙනි පරිපූරකය - 2016 වර්ෂයේ ජනවාරි 18 ට පෙර
  - 2015 වාර්ෂික ගිණුම් සාරාංශයේ දෙවෙනි පරිපූරකය - 2016 වර්ෂයේ ජනවාරි 31 ට පෙර
  - වැටුප් හා සේවක සංඛ්‍යා පිළිබඳ වාර්තාව - සෑම මාසයකම 15 ට පෙර
  - පොදු 172 කුවිතාන්සි පිළිබඳ වාර්තාව - සෑම මාසයකම 10 ට පෙර
  - නිල බැංකු ගිණුම් පිළිබද වාර්තාව - සෑම මාසයකම 15 වන දිනට පෙර
  - අග්‍රිම ගිණුම් සැසඳුම් වාර්තාව - කාර්තුවකට වරක්
  - 2015 පොදු තැම්පතු ගිණුම් ශේෂ වාර්තාව - 2016 වර්ෂයේ වැඩ කරන පළමු දිනයන්හිදී
  - 2017 මු.රෙ 135 බලය බෙදා දීමේ වාර්තාව - 2016 වර්ෂයේ අවසාන දිනට පෙර
  - 2017 වාර්ෂික අක් මුදල් ඉල්ලුම් පත්‍රය - 2016 වර්ෂයේ දෙසැම්බර් අවසාන දිනට පෙර

- විගණකාධිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු මාසික බැංකු සැසඳුම් වාර්තා සෑම මසකම 15 වන දිනට පෙර ඉදිරිපත් කිරීම.

- අමාත්‍යාංශයේ මූල්‍ය කළමනාකරණ කටයුතු, මුදල් රෙගුලාසි, භාණ්ඩාගාර චක්‍රලේඛ හා නියෝග වලට අනුකූලව පවත්වාගෙන යන ලද අතර මේ අනුව සියළුම ලැබීම් ගෙවීම් කටයුතු හා ගිණුම් කටයුතු නිසි ලෙස පවත්වාගෙන යන ලදී.

- 2015 වර්ෂයේ විසර්ජන ගිණුම් වාර්තාව ගිණුම් පියවීමේ චක්‍රලේඛයට අදාළ වාර්තා සහ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම සැසඳීමේ වාර්තාව නියමිත දිනට පෙර අදාළ ආයතන වෙත ඉදිරිපත් කරන ලදී.

## 3.3.3. අමාත්‍යාංශය සහ ඒ යටතේ පැවති ආයතනවලට අයත් ප්‍රසම්පාදනයන් සිදු කිරීම

- අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව (ඉදිකිරීම්) වාර 10 ක් සහ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව (භාණ්ඩ) වාර 09 ක් රැස්වී ඇති අතර පහත ව්‍යාපෘති සම්බන්ධව තීරණ ගෙන ඇත.

**නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය**

- බත්තරමුල්ල සෙත්සිරිපාය II වන අදියර, 13 වන මහලෙහි ස්ථානගත කර තිබූ නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය බත්තරමුල්ල, සුහුරුපාය ගොඩනැගිල්ලේ 14 වන මහලේ ස්ථාපිත කිරීම සඳහා 2016.09.15 දින ප්‍රසම්පාදන කමිටුව මඟින් ගනු ලැබූ තීරණයන්ට අනුව කාර්යාල පරිශ්‍රය සැකසීමට අදාළ ටෙන්ඩරය රු.39,006,341.00 (වැට් රහිත) මුදලකට ප්‍රදානය කිරීම සහ ඒ අනුව 2016 දෙසැම්බර් මස අවසානය වන විට සුහුරුපාය ගොඩනැගිල්ලෙහි 14 වන මහලෙහි කාර්යාල පරිශ්‍රය ස්ථාපනය කිරීම.

- 2016.05.25 දිනැති 16/විවිධ/05/51 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 2016.12.09 වන දින ජාතික දූෂණ විරෝධී දිනය සැමරීම සඳහා වන සමුළුවේ ඉසව් කළමනාකරණය පිළිබඳ ටෙන්ඩරය රු. 6,347,900.00 (වැට් රහිත) මුදලකට ප්‍රදානය කිරීමට අදාළව 2016.10.26 වන දින අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව මඟින් ප්‍රසම්පාදන තීරණ ගනු ලැබීය.

  ඒ අනුව එම ජාතික සමුළුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාව සහ ජනමාධ්‍ය දෙපාර්තමේන්තුවේද සහයෝගය ඇතුව ප්‍රධාන තාක්ෂණ සැසිය සහ සාකච්ඡාමය තාක්ෂණ සැසි 03 කින් යුතුව ටාජ් සමුද්‍රා හෝටලයේදී අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් මැති ඇමතිවරුන්, විදේශ තානාපතිවරුන් සහ රාජ්‍ය නිලධාරීන් ඇතුළු 600 කට ආසන්න සහභාගීත්වයකින් යුතුව 2016.12.09 වන දින පවත්වන ලදී.

- අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයක් වන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ මූලිකත්වයෙන් සංවිධානය කරන ලද ආසියා පැසිපික් කලාපීය නීතිය බලාත්මක කිරීමේ ජාතික ආයතනයන්හි ප්‍රධානීන්ගේ සහ අමාත්‍ය මණ්ඩල හමුව සඳහා ශ්‍රී ලංකා පොලීසිය සහ විශේෂ කාර්යය බලකාය සඳහා වෙන්ව තිබූ ප්‍රතිපාදන කළමනාකරණය කරමින් රු. 10,856,253.07 ක ප්‍රතිපාදන ලබා දී සමුළුව 2016.06.24 වන දින සිට 2016.06.29 වන දින දක්වා බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී සාර්ථකව පවත්වන ලදී.

**ශ්‍රී ලංකා පොලීසිය**

**1.) කැබිනට් මණ්ඩලය පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව**

- මරදාන පොලිස් ස්ථානයේ තනිකඩ හට නිවාසය ඉදිකිරීමේ ඉතිරි වැඩ නිම කිරීම පිළිබඳ ටෙන්ඩරය රු. 202,949,528.65 (වැට්රහිත) මුදලකට ප්‍රදානය කිරීමට අදාළව 2016.08.26 ප්‍රසම්පාදන තීරණ ගනු ලැබීය.

- හම් සපත්තු 100,000 මිලදී ගැනීම පිළිබඳ ටෙන්ඩරය රු. 295,225.000 (වැට්රහිත) මුදලකට ප්‍රදානය කිරීමට අදාළව 2016.08.26 ප්‍රසම්පාදන තීරණ ගනු ලැබිණ.

**2.) අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව - ඉදිකිරීම්**

- 2016.11.11 ප්‍රසම්පාදන **කමිටු** තීරණය අනුව වැලිගම පොලිස් ස්ථානය ඉදිකිරීම පිළිබඳ ටෙන්ඩරය රු. 89,794,190.17 (වැට්රහිත) මුදලකට ප්‍රදානය කිරීම.

- වෙරළබඩ විවාහක පොලිස් නිල නිවාස ඉදිකිරීම පිළිබඳ ටෙන්ඩරය රු.154,138,088.75 (වැට්රහිත) මුදලකට ප්‍රදානය කිරීමට අදාළව 2016.12.20 ප්‍රසම්පාදන තීරණ ගන්නා ලදී.

**3.) අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව - භාණ්ඩ**

- ක්‍රීඩා සපත්තු 56,500 ක් මිලදී ගැනීම පිළිබඳ ටෙන්ඩරය රු. 199,178,320.00 මුදලකට ප්‍රදානය කිරීමට අදාළව 2016.12.28 ප්‍රසම්පාදන තීරණ ගනු ලැබීය.

**විශේෂ කාර්ය බලකාය**

**1.) අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව - ඉදිකිරීම්**

- 2016.12.20 රැස් වූ ප්‍රසම්පාදන කමිටුව කටුකුරුන්ද විශේෂ කාර්ය බලකායේ පුහුණු පාසලේ තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම පිළිබඳ ටෙන්ඩරය රු. 57,426,550.00 (වැට්රහිත) මුදලකට ප්‍රදානය කිරීමට අදාළව ප්‍රසම්පාදන තීරණ ගනු ලැබීය.

- විශේෂ කාර්ය බලකා මූලස්ථාන කඳවුරේ පාලන හා කාන්තා නිලධාරීන් සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම පිළිබඳ ටෙන්ඩරය රු. 39,511,607.50 මුදලකට ප්‍රදානය කිරීමට අදාළව 2016.12.20 ප්‍රසම්පාදන තීරණ ගනු ලැබීය.

- මහඔය කඳවුරේ රාජ්‍ය නිවේදිත නිලධාරීන්ගේ නිවස්නය ඉදිකිරීම පිළිබඳ ටෙන්ඩරය තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර තිබූ ලංසුකරු 1987 පොදු කොන්ත්‍රාත් පනත අංක 03 හි ලියාපදිංචි වී නොසිටීම හේතුවෙන් ටෙන්ඩරය අවලංගු කර නැවත ලංසු කැඳවීමට 2016.12.20 තීරණය විය.

**2.) අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව - භාණ්ඩ**

- ක්‍රීඩා සපත්තු 8,500 ලබාගැනීමේ ටෙන්ඩරය රු.22,907,500.00 (වැට්රහිත) මුදලකට ප්‍රදානය කිරීමට අදාළව 2016.06.24 ප්‍රසම්පාදන තීරණ ගනු ලැබීය.

- 2016.09.15 දින පාර්සල් සෝදිසි කිරීමේ යන්ත්‍ර 02 ක් මිලදී ගැනීම සඳහා ටෙන්ඩරය රු.12,385,554.00 (වැට්රහිත) මුදලකට ප්‍රදානය කිරීමට අදාළව ප්‍රසම්පාදන තීරණ ගනු ලැබිණ.

- **දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු නිර්දේශ සඳහා අනුමැතිය ලබා දීම**

ශ්‍රී ලංකා පොලීසියට අදාළව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු නිර්දේශයන් සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය (අතිරේක අංක 28) ප්‍රකාරව ප්‍රසම්පාදන 05 ක් සඳහා අමාත්‍යාංශ අනුමැතිය ලබා දීමට කටයුතු කර ඇත. ඒවා නම්; ගොකරැල්ල පොලිස් ස්ථානය ඉදිකිරීම, පොලිස් වී.පී.එන්. ජාල කලාප පළල පරාසය වැඩිදියුණු කිරීම, මල්ලාවි පොලිස් ස්ථානය ඉදිකිරීම, පොලිස් රෝහලට මාස 03ක් සඳහා ඖෂධ මිලදී ගැනීම සහ කතරගම මැණික් සිසිල කණ්ඨ පොලිස් නිලධාරීන්ගේ නිවාඩු නිකේතනය අළුත්වැඩියා කිරීම වේ.

- ප්‍රසම්පාදන ලංසු විවෘත කිරීම

2016 වර්ෂය තුළ ලංසු විවෘත කිරීම් 10ක් සිදුකර ඇත. ඉන් අමාත්‍යාංශය සුහුරුපාය ගොඩනැගිල්ලේ 14වන මහලේ ස්ථාපිත කිරීම හා දූෂණ විරෝධි සමුළුවෙහි ඉසව් කළමනාකරණය යන විවෘත කිරීම් දෙක අමාත්‍යාංශයටත් කටුකුරුන්ද විශේෂ කාර්ය බලකායේ පුහුණු පාසලේ තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම, විශේෂ කාර්ය බලකා මූලස්ථාන කඳවුරේ පාලන හා කාන්තා නිලධාරීන් සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම හා මහඔය කඳවුරේ රාජ්‍ය නිවේදිත තිළධාරීන්ගේ නිවස්නය ඉදිකිරීම යන ලංසු විවෘත කිරීම් 03ක් විශේෂ කාර්ය බලකායටත් අදාළවන අතර මරදාන පොලිස් ස්ථානයේ තනිකඩ හට නිවාසය ඉදිකිරීම, හම් සපත්තු 100,000 මිලදී ගැනීම, වැහිකබා 65, 000ක් ලබාගැනීම, ක්‍රීඩා සපත්තු 65, 500ක් මිලදී ගැනීම හා වෙරළබඩ විවාහක පොලිස් නිල නිවාස ඉදිකිරීම_යන ලංසු විවෘත කිරීම් 05ක් ශ්‍රී ලංකා පොලීසියට අදාළව වේ.


- ප්‍රසම්පාදනයන්ගේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ පැනනගින ගැටළුකාරී තත්ත්වයන් නිරාකරණය කිරීමේ අරමුණින් 2016 වර්ෂය තුළදී ප්‍රසම්පාදන ප්‍රගති සමාලෝචන රැස්වීම් වාර 04 කදී පවත්වා ඇත.

- ප්‍රසම්පාදනයන්ට අදාළව ණයවර ලිපි ලබාගැනීමට අවශ්‍ය වූ අවස්ථාවන් සඳහා ශ්‍රී ලංකා පොලීසිය වෙනුවෙන් ණයවර ලිපි 21ක් සහ විශේෂ කාර්ය බලකාය වෙනුවෙන් ණයවර ලිපි 02ක් නිකුත් කර ඇත.

## 3.3.4. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම

- අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගතයුතු කාර්යයන් සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශ 04 ක් සකස් කර ගරු අමාත්‍යතුමාගේ අත්සනින් යුතුව අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීම සහ අදාළ අනුමැතිය ලද පසු ඒ අනුව ක්‍රියා කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

## 3.4. සැලසුම් සහ අධීක්ෂණ අංශය




- රාජ්‍ය මුදල් චක්‍රලේ අංක 1/2014 අනුව 2016 වර්ෂයට අදාළව අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම සකස්කර අදාළ ආයතන වලට ඉදිරිපත් කිරීම.

- ශ්‍රී ලංකා පොලීසියේ සහ විශේෂ කාර්ය බලකායේ සංවර්ධන ව්‍යාපෘති යෝජනා 17 ක් ඇගයීමට ලක් කර එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නිර්දේශ අයවැය දෙපාර්තමේන්තුවට ලබාදීමට හැකිවන සේ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

- අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගතයුතු සංවර්ධන ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල සංදේශ 25 ක් සකස් කර ගරු අමාත්‍යතුමාගේ අත්සනින් යුතුව අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීම සහ අදාළ අනුමැතිය ලද පසු එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ ආයතන වෙත ලබාදීම හා ව්‍යාපෘති පිළිබඳ පසු විපරම් කටයුතු සිදු කිරීම. මේ යටතේ ශ්‍රී ලංකා පොලීසියට අදාළව අමාත්‍ය මණ්ඩල සංදේශ 15ක්, විශේෂ කාර්ය බලකායට අදාළව අමාත්‍ය මණ්ඩල සංදේශ 08ක් සහ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයට අදාළව අමාත්‍ය මණ්ඩල සංදේශ 02ක් ඉදිරිපත් කර ඇත.

- අමාත්‍යාංශයේ සහ අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල මාසික සහ කාර්තුමය ප්‍රගති වාර්තා සකස්කර ජනාධිපති ලේකම් කාර්යාලයට ව්‍යාපෘති කළමනාකරණ හා මෙහෙයුම් දෙපාර්තමේන්තුවට සහ අනෙකුත් අදාළ ආයතන වෙත ඉදිරිපත් කිරීම.


- ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2015.12.29 දිනැති අයවැය චක්‍රලේඛ 06/2015 අනුව ප්‍රගති වාර්තා පෝරම අර්ධ මාසිකව, මාසිකව, කාර්තුමය වශයෙන් අයවැය දෙපාර්තමේන්තුවට යොමු කිරීම.

- අමාත්‍යාංශයේත් අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වලත් වර්ෂයේ ක්‍රියාකාරකම්, සැලසුම් කළ ආකාරයෙන් ඉටුකරන්නේද යන්නත්, විචලතා ඇත්නම් ඊට හේතුත්, ගැටළු සඳහා ගතයුතු පියවර පිළිබඳවත් විමසීම සහ සාකච්ඡා කිරීම සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් හතරක් (04) වර්ෂය තුළ පැවැත්වීම හා ඊට අදාළ පසු විපරම් කටයුතු සිදුකිරීම.




*ප්‍රගති සමාලෝචන රැස්වීමක අවස්ථාවක්*

- රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 අනුව සැකසූ අමාත්‍යාංශයේ 2015 වර්ෂයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව නියමිත දිනට පෙර පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා තෛභාෂාවෙන් මුද්‍රිත හා සීඩී පට ආකාරයෙන් සකස් කර ඉදිරිපත් කිරීම සහ අනෙකුත් අදාළ ආයතන වෙත ඉදිරිපත් කිරීම.




- ශ්‍රී ලංකා පොලිසියේ 2014 සහ 2015 වර්ෂවල කාර්ය සාධන වාර්තා, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ 2013 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව යන කාර්යසාධන වාර්තා ගරු අමාත්‍යතුමාගේ අත්සනින් යුතු ආවරණ ලිපි සමඟ පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු කිරීම.

- නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ 2017 අය වැය විසර්ජන පනත සාකච්ඡාවට ගනු ලැබූ 2016.11.21 දින පැවති පාර්ලිමේන්තු විවාදයේදී ප්‍රයෝජනයට ගතහැකිවනසේ ප්‍රගති වාර්තාව 2016 ප්‍රකාශනය තෛභාෂාවෙන් මුද්‍රිත හා සීඩී පට ආකාරයෙන් සකස් කර ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.




- ශ්‍රී ලංකා මහ බැංකුවේ 2015 වර්ෂයේ වාර්ෂික වාර්තාව සඳහා අවශ්‍ය තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කිරීම.

- දක්ෂිණ සංවර්ධන විෂය භාර අමාත්‍යාංශය වශයෙන් දක්ෂිණ ප්‍රදේශයේ ගාල්ල, මාතර, හම්බන්තොට සහ මොණරාගල යන දිස්ත්‍රික්ක වල විමධ්‍යගත අය වැය වැඩසටහන ක්‍රියාත්මක කරමින් ව්‍යාපෘති අනුමත කිරීමේ වගකීම මෙම අමාත්‍යාංශය දරණු ලබන අතර ඒ සම්බන්ධ කටයුතු සැලසුම් අංශය මඟින් සිදු කරනු ලබයි. ඒ අනුව එක් එක් දිස්ත්‍රික්කයේ 2016 අනුමත ව්‍යාපෘති ගණන පහත වගුවෙන් දැක්වේ.

**විමධ්‍යගත අය වැය වැඩසටහන ප්‍රගතිය**

**සංඛ්‍යා වගුව - 17**

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රතිපාදන ප්‍රමාණය 2016 (රු.මි.) | පාර්ලිමේන්තු මන්ත්‍රීන් ගණන | අනුමත කරන ලද ව්‍යාපෘති ගණන |
|---|---|---|---|---|
| 01 | ගාල්ල | 150 | 10 | 1,233 |
| 02 | මාතර | 120 | 08 | 837 |
| 03 | හම්බන්තොට | 105 | 07 | 785 |
| 04 | මොණරාගල | 75 | 05 | 515 |
| **එකතුව** | | **450** | **30** | **3,370** |

*මූලාශ්‍රය- සැලසුම් අංශය*

- 2016 වර්ෂය තුළ දක්ෂිණ ප්‍රදේශය සංවර්ධනය සඳහා 2015 අයවැය කථාවේදී වෙන්කළ රු.මි.1,000 ක ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් ව්‍යාපෘති 689 ක් දිස්ත්‍රික්ක තුනක් තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අක්මුදල් නිදහස් කිරීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට අවශ්‍ය නිර්දේශය ලබා දීමට අදාළ ව්‍යාපෘති වාර්තා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට යොමු කිරීම.

- ළමයින් හා කාන්තාවන්ට අදාළ තොරතුරු අවශ්‍ය ආකාරයෙන් ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශයට ලබා දීම, මෙම අමාත්‍යාංශයේ සේවය කරන නිලධාරීන්ගේ ගැටළු වලට උපදෙස් ලබා දීමට අවශ්‍ය සම්බන්ධීකරණය කිරීම සහ එම අමාත්‍යාංශයේ සහ මෙම අමාත්‍යාංශයේ මූල්‍ය අනුග්‍රාහකත්වය ඇතිව මෙම අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල නිලධාරීන් සඳහා විවිධ තේමාවන් ඔස්සේ වැඩසටහන් 05 ක් සිදුකිරීම. එම වැඩසටහන් පිළිබඳ විස්තර පහත වගුව මඟින් දැක්වේ.

**පැවැත්වූ වැඩසටහන් පිළිබඳ විස්තර**

**සංඛ්‍යා වගුව - 18**

| වැඩසටහනේ නම | ක්‍රියාත්මක කළ දිනය | සම්පත් දායකත්වය | සහභාගීත්වය |
|---|---|---|---|
| ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ආකල්ප හේතුවෙන් කාන්තාව මුහුණපාන ගැටළු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 2016.03.23 | වී. වීරසිංගම් මහතා (ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා ගැටුම් පරිවර්තනය පිළිබඳ පුහුණු උපදේශක) | නිලධාරීන් 69 |
| උපදේශන සේවා වැඩමුළුව | 2016.05.10 | නිමල්සිරි රණසිංහ මහතා (ජ්‍යෙෂ්ඨ උපදේශන නිලධාරී, ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය), නදීශා අමරකෝන් මහත්මිය (උපදේශන නිලධාරී, ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය) | නිලධාරීන් 71 |
| පිළිකා සහ දියවැඩියා රෝගය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 2016.06.03 | සිසිල් මධුරසිංහ මහතා (මනෝවිද්‍යාව පිළිබඳ ප්‍රවීන දේශක) | නිලධාරීන් 44 |
| ගීතය තුළින් ඇය දකිමු දැනුවත් කිරීමේ වැඩසටහන | 2016.09.06 | වැඩසටහන සඳහා මෙම අමාත්‍යාංශයීය සහ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයීය නිලධාරීන් සහභාගී වූ අතර උපදේශන සහය නිමල්සිරි රණසිංහ මහතා (ජ්‍යෙෂ්ඨ උපදේශන නිලධාරී, ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය), සහ අනෝකා ගුණරත්න මහත්මිය (නීති නිලධාරී, ජාතික කාන්තා කමිටුව) ලබා දුණි. | නිලධාරීන් 101 |
| ලෝක ළමා දිනයට සමගාමීව දරුවාගේ සෞඛ්‍ය, පෝෂණය හා රැකවරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 2016.10.24 | රජරට විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දුමින්ද ගුරුගේ මහතා. | නිලධාරීන් 67 |

*මූලාශ්‍රය- සැලසුම් අංශය*

## 3.5. සංවර්ධන අංශය

2016 වර්ෂයේ සැප්තැම්බර් මාසයේදී නව අංශයක් ලෙස අමාත්‍යාංශය තුළ සංවර්ධන අංශය ස්ථාපිත කළ අතර ඒ යටතේ පහත කාර්යයන් ඉටු කරන ලදී.

- ශ්‍රී ලංකා පොලීසියේ පොලිස් කොස්තාපල් තනතුරේ සිට පොලිස් පරීක්ෂක තනතුර දක්වා ඉදිරිපත් වී තිබූ විනය නියෝග අතරින් නිලධාරීන් 298 දෙනෙකුගේ සේවය අත්හිටුවීමටත් නිලධාරීන් 712 දෙනෙකුට නැවත සේවය ලබා දීමටත් කටයුතු කරන ලදී. ඉතිරි නිලධාරීන් සඳහා නැවත පරීක්ෂණ පැවැත්වීමට තීරණය කෙරුණි.

- ශ්‍රී ලංකා පොලීසියේ පොලිස් පරීක්ෂක තනතුරේ සිට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තනතුර දක්වා ඉදිරිපත් වූ විනය නියෝග 200ක් අතුරින් නිලධාරීන් 25 දෙනෙකුගේ සේවය අත්හිටුවීමටත්, නිලධාරීන් 175 දෙනෙකු නැවත සේවයේ පිහිටුවීමටත් කටයුතු සලසන ලදී.

- විශේෂ කාර්ය බලකා නිලධාරීන්ගේ විනය කටයුතු සම්බන්ධයෙන් 2016 වර්ෂය තුළදී ලද විනය නියෝග අතරින් නිලධාරීන් 50 දෙනෙකුගේ සේවය අත්හිටුවීමටත් නිලධාරීන් 250 දෙනෙකුට නැවත සේවය ලබා දීමටත් කටයුතු කරන ලදී. ඉතිරි නිලධාරීන් සඳහා නැවත පරීක්ෂණ පැවැත්වීමට තීරණය කෙරුණි.

- පොලිස් ස්ථාන, පොලිස් මුරපොළවල්, විශේෂ කාර්ය බලකා කඳවුරු, රාජ්‍ය නිවේදිත නිලධාරීන්ගේ නිවාඩු නිකේතන ආදිය සඳහා ඉඩම් 498 ක ප්‍රමාණයක් පවරා ගැනීමට අවශ්‍ය මූලික ක්‍රියාමාර්ග ගෙන ඉන් ඉඩම් 200ක නිරවුල්භාවය පරීක්ෂා කිරීම අවසන් කර ඇත.

- අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ගැටළු සහගතව පැවති බඳවා ගැනීම් පටිපාටිය සංශෝධනය කිරීම පහත දැ සහිතව සිදු කෙරුණි.
    - අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය යටතට ගැනුණු තනතුරු 08 කින් සමන්විත පුරෝගාමී පාලන අධිකාරිය තනතුරු බඳවා ගැනීම් පටිපාටියට අනුව අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයට පවරා ගැනීම.
    - පුරෝගාමී පාලන අධිකාරිය සඳහා අනුමත කර තිබූ ලේකම් තනතුර නියෝජ්‍ය අධ්‍යක්ෂ - පුරෝගාමී රසායන ලෙසත් පරිපාලන නිලධාරී තනතුර කළමණාකරු - මධ්‍යස්ථාන හා ප්‍රවාහන ලෙසත් සංශෝධනය කිරීම.

- ගාලු උරුමය පදනමේ 2015 වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය අවසන් කිරීම සහ අඩුපාඩු පෙන්වා දෙමින් ඉදිරි සැලසුම් සහ රාජ්‍ය දේපළ ආරක්ෂා කිරීම සම්බන්ධ උපදෙස් ලබා දීම.

- ගාලු උරුමයක් වූ කොටු පවුර අළුත් වැඩියා කටයුතු සම්බන්ධයෙන් අනුමැතිය සහ අවශ්‍ය උපදෙස් ගාලු උරුමය පදනමට ලබා දීම.

## 3.6. අභ්‍යන්තර විගණන අංශය

- 2016 වර්ෂය සඳහා අමාත්‍යාංශය, විශේෂ කාර්ය බලකාය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, ගාලු උරුමය පදනම යන ආයතන වල වාර්ෂික විගණන සැලැස්ම පිළියෙල කිරීම.

- අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල අභන්තර විගණන අංශවල සමාලෝචන කටයුතු, විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමේ ප්‍රගතිය, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රගතිය ඇතුළු අනෙකුත් මූල්‍ය හා පරිපාලන කටයුතුවලට අදාළ චක්‍රලේඛ හා නීති රීති අනුව ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම සහ විචලතා සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට හැකිවනසේ විගණන සැලැස්මට අනුව පළමු, දෙවන, තෙවන හා සිව්වන කාර්තු සඳහා අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.

- අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින අනෙකුත් ආයතන වෙත විගණකාධිපති විසින් නිකුත් කරනු ලැබූ විගණන විමසීම් හා විගණන ඡේද සඳහා පිළිතුරු කැඳවීම, සම්බන්ධීකරණය හා එම කටයුතු පසු විපරම් කිරීම. මේ යටතේ විගණන විමසීම් 05 කට සහ විගණන ඡේද 04 කට පිළිතුරු කැඳවීම හා සම්බන්ධීකරණය කර තිබේ.

- 2016 අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව අමාත්‍යාංශයේ සහ අනුබද්ධ ආයතනවල විගණන කටයුතු සිදු කිරීම සහ ඊට අදාළව අමාත්‍යාංශය, ශ්‍රී ලංකා පොලීසිය, විශේෂ කාර්ය බලකාය, ගාලු උරුමය පදනම, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සියළුම ප්‍රතිකාර මධ්‍යස්ථාන සඳහා විගණන විමසුම් 05 ක් ඉදිරිපත් කිරීම.

- ශ්‍රී ලංකා පොලීසිය සම්බන්ධයෙන් 2016/06/22 දින පැවති ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කිරීම සඳහා පිළිතුරු වාර්තා සකස් කිරීම ඇතුළු ඊට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම හා රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා පොලීසිය සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීම හා එම කටයුතු පසු විපරම් කිරීම.

- අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල 2016 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා මාසික මූල්‍ය වාර්තා පිළියෙල කර තිබේද යන්න තහවුරු කර ගැනීම, එම වාර්තා පරීක්ෂා කිරීම හා ඇගයීම.

- 2016 වර්ෂය තුළදී අමාත්‍යාංශය වෙත යොමු කරන ලද පෙත්සම් 05 ක් විභාග කර වාර්තා ලබා දීමට කටයුතු කිරීම.

- 2016 වර්ෂය තුළදී සිදු කරන ලද විගණන කටයුතු සම්බන්ධයෙන් වාර්තා 04 ක් සකස් කර කළමනාකරණ හා විගණන දෙපාර්තමේන්තුවට යොමු කිරීම.

- රජයේ විගණකාධිපති විගණන විමසුම්, අභ්‍යන්තර විගණන විමසුම් හා ඒවාට පිළිතුරු ලැබීම් පිළිබඳව විගණන විමසුම් ලේඛණය පවත්වාගෙන යාම.